# වාර්ෂික කාර්ය සාධන වාර්තාව

# வருடாந்த செயலாற்றுகை அறிக்கை

# Annual Performance Report

# 2019

ජනමාධ්‍ය අමාත්‍යාංශය

வெகுசன ஊடக அமைச்சு

Ministry of Mass Media

# 2019 වර්ෂය සඳහා
# වාර්ෂික කාර්ය සාධන වාර්තාව

## වැය ශීර්ෂ අංකය : 55

2020.01.30 දින රාජ්‍ය මූල්‍ය දෙපාර්තමේන්තුව විසින් හඳුන්වා දෙන ලද ආකෘති පත්‍රය ප්‍රකාරව
මෙම වාර්තාව සකස් කොට ඇත.

# අන්තර්ගතය


| | | පටුන | පිටුව |
|---|---|---|---|
| **පරිච්ඡේදය 01** | **-** | **ආයතනික පැතිකඩ / ක්‍රියාවට නැංවීමේ සාරාංශය** | 1-14 |
| **පරිච්ඡේදය 02** | **-** | **ප්‍රගතිය හා ඉදිරි දැක්ම** | 15 - 24 |
| **පරිච්ඡේදය 03** | **-** | **වසරේ සමස්ථ මූල්‍ය කාර්ය සාධනය** | 25 - 42 |
| **පරිච්ඡේදය 04** | **-** | **කාර්ය සාධන දර්ශක** | 43 - 46 |
| **පරිච්ඡේදය 05** | **-** | **තිරසාර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්ය සාධනය** | 47 - 50 |
| **පරිච්ඡේදය 06** | **-** | **මානව සම්පත් පැතිකඩ** | 51 - 56 |
| **පරිච්ඡේදය 07** | **-** | **අනුකූලතා වාර්තාව** | 57 - 67 |

# 01 පරිච්ඡේදය

## ආයතනික පැතිකඩ/ක්‍රියාවට නැංවීමේ සාරාංශය

# ආයතනික පැතිකඩ / ක්‍රියාවට නැංවීමේ සාරාංශය

1.1 හැඳින්වීම

1.2 ආයතනයේ දැක්ම, මෙහෙවර, අරමුණු

1.3 ප්‍රධාන කාර්යයන්

1.4 සංවිධාන සටහන

1.5 අමාත්‍යාංශ යටතේ පවතින දෙපාර්තමේන්තු

1.6 අමාත්‍යාංශය යටතේ පවතින ආයතන / අරමුදල්

1.7 විදේශ ආධාර ලබන ව්‍යාපෘතිවල තොරතුරු

අ) ව්‍යාපෘතිය

ආ) දායක නියෝජිතායතනය

ඇ) ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත වියදම

ඇ) ව්‍යාපෘති කාල සීමාව

## 1.1 හැඳින්වීම

ජන සමාජයේ යහ පැවැත්ම උදෙසා ජනමාධ්‍ය අමාත්‍යාංශයෙන් ඉටුවන කාර්යභාරය අතිමහත්ය. තොරතුරු සා පිපාසාවෙන් පෙළෙන ජන ප්‍රජාවට ජනමාධ්‍ය ක්ෂේත්‍රය අතිශයින් හුරුපුරුදු ක්ෂේත්‍රයක් වන අතරම ජනතා හදගැස්ම හඳුනාගත් යහපත් ජනමාධ්‍ය රටට සම්පතක් පමණක් නොව රට සාර්ථකත්වය උදෙසා සංවර්ධන ක්‍රියාවලිය බලගන්වනු ලබන්නා වූ සක්‍රීය මෙවලමකි.

වගකීම් සහගතවූත් ආචාර ධර්මානුකූලවූත් මාධ්‍ය සම්ප්‍රදායක් උදෙසා වන නීති හා අණපනත් වලට අදාල ප්‍රතිපත්ති සම්පාදනය කර මාධ්‍ය නිදහස සුරකිමින් කටයුතු කිරීම ජනමාධ්‍ය අමාත්‍යාංශයෙහි ප්‍රමුඛතම කාර්යභාරයන් වේ. ගුණාත්මක මාධ්‍ය සම්ප්‍රදායක් උදෙසා ජනමාධ්‍ය නීති සම්පාදනය කිරීම අතිශයින් වැදගත් කර්තව්‍යයක් වේ. ජනතාව වෙත තොරතුරු දැනගැනීමට ඇති අයිතිය මෙන්ම ප්‍රකාශනයෙහි සහ අදහස් දැක්වීමෙහි නිදහස පිළිබඳ අයිතිය සහතික කිරීම උදෙසා මෙම අමාත්‍යාංශය සුවිශේෂී කාර්යභාරයක් ඉටු කරන ලදී.

තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනත (RTI) ක්‍රියාත්මක කිරීම, ජනාධිපති මාධ්‍ය සම්මාන උළෙල පැවැත්වීම සහ විකාශන නියාමනය කිරීමේ පනත (කෙටුම්පත) සකස් කිරීම සුවිශේෂී ව්‍යාපෘති ලෙස 2019 වර්ෂයේදී ක්‍රියාත්මක කරන ලදී. මාධ්‍යවේදීන් දැනුමින් සහ අත්දැකීම් වලින් පෝෂණය කර ඔවුන් සතු ශක්‍යතාව ඔප්නැංවීම සහ මාධ්‍ය ක්ෂේත්‍රයේ සංවර්ධනය උදෙසා අවශ්‍ය වන්නා වූ පහසුකම් සම්පාදනය කිරීම අමාත්‍යාංශයේ භූමිකාව වේ. "ඇසි දිසි" ශිෂ්‍යත්ව වැඩසටහන මගින් එකී අභිමතාර්ථය යථාර්ථයක් බවට පත්වී ඇත.

ශ්‍රී ලංකාව සුපෝෂිත දේශයක් ලෙස නැංවීම සැලසුම් කොට ඉලක්ක කොටගත් වැඩසටහන් රජය විසින් ක්‍රියාත්මක කරන ලදී. රජයේ මෙකී ක්‍රියාවලිය සාක්ෂාත් කර ගැනීමෙහිලා ජනමාධ්‍යයන්හි දිශානතිය සැකසීමට ජනමාධ්‍ය අමාත්‍යාංශයෙහි වගකීම අතිමහත්ය.

ජනමාධ්‍ය අමාත්‍යාංශයේ විෂය පථය පසුගිය කාලසීමාවේදී අවස්ථා කිහිපයකදීම සංශෝධනයට ලක්විය. 2017.06.09 දින අංක 2022/34 දරණ අති විශේෂ ගැසට්පත්‍රය මගින් ජනමාධ්‍ය අමාත්‍යාංශයේ විෂය පථයට අයත් ආයතන 11ක් මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යාංශය යටතට නම් කෙරිණි.

2018.02.20 දින අංක 2059/23 දරණ ගැසට්පත්‍රය මගින් තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ කොමිෂන් සභාව ද මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යාංශයේ විෂය පථයට යාකරන ලදී.

2019.02.26 දින අංක 2112/13 දරණ ගැසට්පත්‍රය මගින් අමාත්‍ය මණ්ඩල සාමාජිකයෙකු නොවන අමාත්‍යවරයෙකු යටතට ජනමාධ්‍ය අමාත්‍යාංශය නම් කරන ලද අතර රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව හා තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ කොමිෂන් සභාව ද ඇතුලත්ව ජනමාධ්‍ය හා සම්බන්ධ ආයතන සංඛ්‍යාව 9 ක් බවට පත්විය. 2019.12.10 දින අංක 2153/12 දරණ අතිවිශේෂ ගැසට් පත්‍රය මගින් උක්ත ආයතන තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ අමාත්‍යාංශය යටතේ නම් කරන ලදී.

## 1.2 ආයතනික දැක්ම, මෙහෙවර, පරමාර්ථ

**දැක්ම**

මනාව දැනුම්වත් වූ, බහුමතික සහ සක්‍රීය සමාජයක්

**මෙහෙවර**

ජනහිතකාමී වූ, සංවර්ධනයට දිශානත වූ, නිදහස් සහ වගකීම් සහිත ශ්‍රී ලාංකේය ජනමාධ්‍ය කලාවක් ස්ථාපිත කිරීම සඳහා ප්‍රතිපත්ති හා උපාය මාර්ග සැකසීම, පහසුකම් සැලසීම, ක්‍රියාත්මක කිරීම, අධීක්ෂණය හා පසු විපරම

**පරමාර්ථ**

1. වඩා යහපත් මාධ්‍ය සංස්කෘතියක් ගොඩනැංවීම සඳහා අවශ්‍ය සහාය ලබා දීම.
2. මහජනතාවට තොරතුරු වෙත ප්‍රවේශවීමේ සමාන අවස්ථාවන් පුළුල් කිරීම.
3. නවීනතම තාක්ෂණය සමඟ මාධ්‍ය ක්ෂේත්‍රය වෙත පහසුකම් සැලසීම.
4. මාධ්‍යවේදීන්ගේ වෘත්තීයභාවය ඉහල නැංවීම උදෙසා දිරිගැන්වීම.
5. ජාතික සංවර්ධන ප්‍රයත්නයේදී මාධ්‍ය දායකත්වය සහ සහභාගීත්වය ඉහල නැංවීම.
6. ජාත්‍යන්තර වශයෙන් රටෙහි ප්‍රතිරූපය ඔප්නැංවීම උදෙසා නායකත්වය සැපයීම.
7. අමාත්‍යාංශයේ ඉලක්ක සාක්ෂාත් කර ගැනීම සඳහා මානව සම්පත සංවර්ධනය කිරීම.
8. අමාත්‍යාංශය වෙත අනුබද්ධිත වූ ආයතනයන්හි සම්පත් සාර්ථකව ප්‍රයෝජනයට ගැනීම.
9. අදාල පාර්ශවයන් සම්බන්ධීකරණය කිරීම තුලින් සංවර්ධන ක්‍රියාවලිය ශක්තිමත් කිරීම.

## 1.3 ප්‍රධාන කාර්යයන්

(2019.12.10 දිනැති අංක 2153/12 දරණ ගැසට් නිවේදනය ප්‍රකාරවයි)

1. ජාතික ප්‍රතිපත්ති රාමුවට අනුකූලව ජනමාධ්‍ය විෂයට අදාළ ප්‍රතිපත්ති, වැඩසටහන් සහ ව්‍යාපෘති සම්පාදනය කිරීම, ක්‍රියාත්මක කිරීම, පසුවිපරම් කිරීම හා ඇගයීම.

2. ජනතා ආකල්ප යහපත් මානයන් කරා කේන්ද්‍රගත කරමින් ආර්ථික, සමාජීය, සංස්කෘතික හා දේශපාලන ක්ෂේත්‍රයන්හි ප්‍රගමනකාරකයක් ලෙස ජනමාධ්‍යයෙහි දායකත්වය ලබාදීම සඳහා අවශ්‍ය ක්‍රමෝපායන් සම්පාදනය කිරීම.

3. ජනතාව තුළ දැනුම, ආකල්ප රසඥතාවයන් ඇති කරලීම උදෙසා වූ වැඩසටහන් ක්‍රියාත්මක කිරිම.

4. ජනතාවගේ  නිවැරදි තොරතුරු දැන ගැනිමේ අයිතිය තහවුරු කිරිමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම.

5. උසස් මාධ්‍ය සදාචාරයක් ඇති කිරිම සඳහා අවශ්‍ය වැඩසටහන් ක්‍රියාත්මක කිරිම.

## 1.4 සංවිධාන සටහන - 2019

### ජනමාධ්‍ය අමාත්‍යාංශය




| අනෙකුත් තනතුරු : | අනුමත | | අනුමත |
|---|---|---|---|
| ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ සහකාර, සංවර්ධන නිලධාරී | 39 | රාජ්‍ය කළමනාකරණ සහකාර | 22 |
| පර්යේෂණ නිලධාරී | 03 | තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණික (ICT) නිලධාරී | 01 |
| විමර්ශන නිලධාරී (ඉලෙක්ට්‍රොනික සහ මුද්‍රිත මාධ්‍ය) | 13 | තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණික (ICT) සහකාර | 03 |
| පිළිගැනීමේ නිලධාරී | 01 | සහකාර තාක්ෂණික නිලධාරී | 01 |
| රියදුරු | 18 | කාර්යාල සහායක | 20 |

**අනුමත සේවක සංඛ්‍යාව - 145**

**තත්‍ය සේවක සංඛ්‍යාව - 102**

මූලාශ්‍රය : කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව –2019.05.15 දිනැති ලිපිය ප්‍රකාරව

## 1.5 අමාත්‍යාංශය යටතේ ඇති දෙපාර්තමේන්තු

**රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව**

රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව 1948 ජූනි මස 31 දින ආරම්භ කරන ලදී. රාජ්‍ය ප්‍රතිපත්ති, රජයේ සංවර්ධන ක්‍රියාදාමය ඇතුළුව ජාතික වැදගත්කමකින් යුතු කාලීන ක්‍රියාකාරකම් සහ ජනතාව වෙනුවෙන් රජය මගින් ඉටුකරනු ලබන කාර්යභාරය පිළිබඳව මහජනතාව දැනුවත් කිරීම මෙම දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යභාරය වන අතර ගෝලීය තාක්ෂණ ප්‍රවණතාවලට අනුගත වෙමින් තොරතුරු තාක්ෂණ ක්‍රියාවලිය කළමනාකරණය කර, නිදහස් හා වගකිවයුතු උසස් මාධ්‍ය සංස්කෘතියක් ගොඩනැගීම සඳහා අනුබල දීම හා නායකත්වය සැපයීමද ප්‍රධාන අභිමතාර්ථයන් වේ.

## 1.6 අමාත්‍යාංශය යටතේ ඇති ආයතන

i) ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාව
ii) ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාව
iii) සී/ස ස්වාධීන රූපවාහිනී මාධ්‍ය ජාලය
iv) සී/ස එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගම
v) ශ්‍රී ලංකා පුවත්පත් මණ්ඩලය
vi) සැලසිනෙ රූපවාහිනී ආයතනය
vii) ලංකා පුවත් ආයතනය
viii) මහින්ද රාජපක්ෂ ජාතික ටෙලි සිනමා උද්‍යානය
ix) ශ්‍රී ලංකා ජනමාධ්‍ය අභ්‍යාස ආයතනය
x) තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ කොමිෂන් සභාව

### 1.6.1 ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාව

1949 ඔක්තෝබර් 01 වැනි දින ගුවන් විදුලි දෙපාර්තමේන්තුව නැමැති ස්වාධීන ආයතනයක් වශයෙන් ප්‍රතිස්ථාපනය කරන ලද මෙම ආයතනය 1972 මැයි 22 ජනරජ ව්‍යවස්ථාව සම්මත වීමත් සමඟ ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාව ලෙස නාමය වෙනස් කරන ලදී. අනතුරුව ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාව, ගුවන් විදුලි සන්නිවේදනයේ ප්‍රමුඛතම පුරෝගාමී මාධ්‍ය ජාලය ලෙස ශ්‍රාවකයන් කේන්ද්‍රගත කරමින් ඒ ඒ සමාජ අවශ්‍යතා හඳුනාගනිමින් “පහසුකම් සපයන්නෙකු” ලෙස ජනතාවගේ විවිධ අවශ්‍යතා ඉටුකරන විද්‍යුත් මාධ්‍ය ජාලය බවට පත්ව ඇත. දිගු තරංග, මධ්‍යම තරංග, කෙටි තරංග සහ FM තරංග මාලා ඔස්සේ දේශීය විකාශන ජාලය තුළ ජාතික නාලිකා 06 කින්, ප්‍රාදේශීය සේවා 07 කින් සහ ප්‍රජා ගුවන් විදුලි සේවාවකින් සමන්විතව විකාශන කටයුතු සිදුකරනු ලබන අතර ගුවන් විදුලි සංස්ථාව සතු ප්‍රධාන විකාශන මධ්‍යස්ථාන 09 මගින් මුළු දිවයිනම ආවරණය වන පරිදි විකාශන කටයුතු සිදුවේ. මීට අමතරව පුත්තලම හා ත්‍රිකුණාමලය යන ප්‍රතිවිකාශන මධ්‍යස්ථාන මගින් විදේශීය විකාශන කටයුතු

සිදුකරනු ලබයි. විශ්වාසනීය හා අවංක මාධ්‍ය මෙහෙවරකින් යුතු ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාව ශ්‍රාවකයාට වඩාත් සමීපවීම පිණිස තම වෙබ් අඩවිය ඔස්සේ ජාත්‍යන්තරය යාකිරීමේ මාර්ගයට ද ප්‍රවේශ වී ඇත. 1966 අංක 37 දරණ ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථා පනත යටතේ සංස්ථාවෙහි කාර්යභාරය ලැයිස්තුගත කොට තිබේ.

### 1.6.2 ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාව

ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාව 1982 අංක 06 දරණ ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථා පනත මඟින් ස්ථාපිත කරනු ලැබීය. මෙරට රූපවාහිනී ප්‍රචාරක සේවයක් පවත්වාගෙන යාමේ කාර්යය සහ එම සේවය සංවර්ධනය කිරීම, ව්‍යාප්ත කිරීම හා දියුණුකිරීම ද ඒ හා සම්බන්ධ හෝ ඊට ආනුෂාංගික කරුණු සඳහා ද අදාළ පනතෙන් විධිවිධාන සලසා ඇත. ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාවේ ප්‍රධාන ක්‍රියාකාරකම් අතර වැඩසටහන් නිෂ්පාදනය කිරීම හා විකාශනය කිරීම සිදුවේ. ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාව "රූපවාහිනී", "අයි" සහ "නේත්‍රා" වශයෙන් නාලිකා තුනක් ඔස්සේ රූපවාහිනී වැඩසටහන් ක්‍රියාත්මක කරයි. සීඝ්‍රයෙන් වෙනස් වෙමින් පවතින රූපවාහිනී තාක්ෂණයට අනුගත වෙමින් ප්‍රේක්ෂකයින් වෙත උසස් තත්වයේ නිර්මාණයන් ළඟා කර දීම සඳහා ජාතික නාලිකාව වශයෙන් ජාතික වගකීමක් ඉටුකරනු ලැබේ. දශක තුනක කාලයක් තුළ දෙස් විදෙස් සම්මානයට පාත්‍ර වූ උසස් තත්වයේ වැඩසටහන් නිපදවමින් හා ප්‍රවෘත්ති සැපයීමෙන් ප්‍රේක්ෂකයින්ගේ රසඥතාව හා දැනුම ආමන්ත්‍රණය කිරීමට ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාවට හැකිව තිබේ. රටේ ක්‍රියාත්මකවන සංවර්ධන ව්‍යාපෘති සම්බන්ධයෙන් ජනතා දැනුම්වත්භාවය ඉහල නංවමින් ජාතික මාධ්‍ය ආයතනයක් ලෙස සිය මෙහෙවර සාර්ථකව ඉටුකොට තිබේ.

### 1.6.3 සී /ස ස්වාධීන රූපවාහිනී මාධ්‍ය ජාලය

1979 දී සිය මෙහෙයුම් කටයුතු ආරම්භ කළ ස්වාධීන රූපවාහිනී මාධ්‍ය ජාලය රූපවාහිනී සහ ගුවන් විදුලි මාධ්‍ය තුළ ශ්‍රී ලංකාවේ ප්‍රමුඛතම මාධ්‍ය ජාලයක් වශයෙන් කටයුතු කරමින් සිටී. සී/ස ස්වාධීන රූපවාහිනී මාධ්‍ය ජාලය (ITN) රජය සතුවූ පොදු සමාගමක් ලෙස පවත්වාගෙන යනු ලබන අතර ශ්‍රී ලාංකික ප්‍රේක්ෂකයන් වෙනුවෙන් ස්වාධීන රූපවාහිනීය ITN හා වසන්තම් TV ලෙස රූපවාහිනී නාලිකා දෙකක්ද ITN FM හා වසන්තම් FM ලෙස ගුවන් විදුලි සේවා දෙකක් ද පවත්වා ගෙනයනු ලැබේ. මෑත කාලීනව ඉතාමත් ප්‍රබල රූපවාහිනී හා ගුවන් විදුලි මාධ්‍ය ජාලය බවට ස්වාධීන රූපවාහිනී මාධ්‍ය ජාලය වර්ධනය වූ අතර, මුළු මහත් ශ්‍රී ලංකාව පුළුල්ව ආවරණය කෙරෙන ඉතා ප්‍රබල විකාශන ශක්තියක් සතු වේ. මුල් අවධියේ සිටම උසස් ප්‍රමිතියකින් යුතු වැඩසටහන් සිය ප්‍රේක්ෂක පිරිස වෙනුවෙන් පෙළගස්වන්නට ස්වාධීන රූපවාහිනිය සමත්වූ අතර ශ්‍රී ලාංකේය සංස්කෘතික, සමාජයීය හා ආගමික සාරධර්ම අනුගමනය කරමින් පවුලේ නාලිකාව ලෙස නමක්, ගරුත්වයක් හා ඉහළ පිළිගැනීමක් ද අත්කරගෙන ඇත.

### 1.6.4 සී /ස එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගම

"ලේක්හවුස්" නමින් ප්‍රචලිත සී/ස එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගම 1926 දී ශ්‍රී ලංකාව තුළ පිහිටුවන ලද රජය සතු සීමිත සමාගමකි. 1973 අංක 28 දරණ සී/ස එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගමේ (විශේෂ විධිවිධාන) පනත අනුව එහි 88% ක හිමිකාරීත්වය රජය වෙනුවෙන් මහා භාරකාර දෙපාර්තමේන්තුව විසින් දරයි. වර්තමානය වනවිට රටේ ප්‍රධානතම පුවත්පත් මුද්‍රණ ආයතනය ලෙස සිය ස්ථානය රැකගෙන සිටී.

අන්තර්ජාලය ජංගම දුරකථන තුළට පිවිසීමත් සමග දිනමිණ, ඩේලිනිවුස් හා තිනකරන් පුවත්පත්වල ජංගම මෘදුකාංගයන් එළිදැක්වීමට ද කටයුතු කර ඇති අතර අන්තර්ජාලය හා සමාජ මාධ්‍ය ජාල තුළ ලේක්හවුස් වෙබ් පිටුව පරිහරණය කරන්නන්ට වැඩි විනෝදාස්වාදයක් ලබාදෙන අයුරින් පුවත් විකාශය කිරීම සඳහා නව ශබ්දාගාරයක් ද හඳුන්වාදී ඇත. ශත වර්ෂයකට ආසන්න සිය ගමන් මග තුළ මාධ්‍ය කර්මාන්තයේ පෙරලිකරු ලෙස තම ස්ථානය තහවුරුකර ගැනීමට ලේක්හවුස් ආයතනය සමත්ව ඇත. ජාතික ආයතනයක් වශයෙන් මාධ්‍ය කර්මාන්තයේ මෙන්ම ජාතියේ යහපත වෙනුවෙන් කටයුතු කිරීම හා එම අරමුණු මත පදනම්ව ආයතනයේ අඛණ්ඩ වර්ධනයක් ලඟාකර ගැනීම ලෙක්හවුස් ආයතනයේ ප්‍රමුඛ කාර්යභාරයයි.

### 1.6.5 ශ්‍රී ලංකා පුවත්පත් මණ්ඩලය

1973 අංක 05 දරණ ශ්‍රි ලංකා පුවත්පත් මණ්ඩල පනත යටතේ ස්ථාපිත කර ඇති ශ්‍රි ලංකා පුවත්පත් මණ්ඩලය මෙම අමාත්‍යාංශය යටතේ කටයුතු කරන ව්‍යවස්ථාපිත මණ්ඩලයකි. පුවත්පත් නිදහස ආරක්ෂා කරගැනීම මෙම මණ්ඩලයේ ප්‍රමුඛ අරමුණ වන අතර, එම නිදහස අයුතු ලෙස භාවිතා කිරීම වැළැක්වීම, පුවත්පත්වල අන්තර්ගතයන්හි ගුණාත්මකභාවය ඉහළ නැංවීම, මහජනයා සතු සත්‍ය කරුණු දැනගැනීමේ අයිතිය  තහවුරු කිරීම යන අරමුණුද අවශේෂ අනෙකුත් අරමුණු අතර වැදගත් වේ. පුවත්පත් වාර්තාවල පළවන ඇතැම් විවාදාත්මක කරුණු සම්බන්ධයෙන් ආචාරධර්මානුකූලව මාධ්‍යවේදීන් හැඩගන්වමින් යම් නෛතික ප්‍රවේශ ඔස්සේ මාධ්‍යවේදීන් සඳහා මඟපෙන්වීමේ කටයුතු මෙන්ම, මාධ්‍යවේදීන් දැනුවත් කිරීමේ වැඩසටහන් සහ ඔවුන්ගේ වෘත්තීමය තත්වය ඉහළ දැමීමටත් විශේෂ අවධානයක් යොමුකර ඇත.

පුවත්පත් විධිමත් කිරීම, පුවත්පත් නිෂ්පාදනයෙහි හෝ පළකිරීමෙහි නියුක්ත සියලු අංශ අතර ක්‍රියාකිරීමේ නිසි සම්බන්ධතාවයකට අනුබල දීම, පුවත්පත් භාවිතය හා පුවත්පත්වල අවශ්‍යතා පිළිබඳව පර්යේෂණ පැවැත්වීම, පත්‍ර කලාවේදී වෘත්තියට බඳවා ගැනීමේ ක්‍රම, සුබසාධනය අධ්‍යාපනය හා පුහුණුකිරීම් වැඩිදියුණු කිරීම හා පුවත්පත් පවත්වාගෙන යාමට අදාළ කවර කරුණක් සම්බන්ධයෙන් වුවද කටයුතු කිරීම පුවත්පත් මණ්ඩලය සතුකාර්යභාරය වේ.

### 1.6.6 සැලසිනේ රූපවාහිනී ආයතනය

එවකට සැලසුම් ක්‍රියාත්මක කිරීමේ අමාත්‍යාංශයට අනුබද්ධිතව 1982 වර්ෂයේ දී ස්ථාපිත කරන ලද සැලසිනේ රූපවාහිනී ආයතනය, 1997.06.09 දිනැති 979/2 දරණ අතිවිශේෂ ගැසට් නිවේදනයේ සිට මේ දක්වා වරින් වර ජනමාධ්‍ය විෂය පථය අයත් අමාත්‍යාංශ යටතට ගැසට් කෙරුණි. මෙම ආයතනය මූලිකවම රාජ්‍ය දැන්වීම් පළ කරන ආයතනයක් මෙන්ම ඉසව් කළමනාකරණ ආයතනයක් ලෙසද ක්‍රියාත්මක වන ලදී. ස්වාධීන නෛතික ආයතනයක් ලෙස ස්ථාපිතවී නොමැති නමුදු, 2007 අංක 07 දරණ සමාගම් පනත යටතේ මහා භාණ්ඩාගාරයේ ලේකම්ට 100%ක හිමිකාරීත්වය සහිතව මෙම ආයතනය ඈපයෙන් සීමිත සමාගමක් ලෙස ව්‍යවස්ථාපිත වීම සඳහා අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය ලබා දී ඇත.

### 1.6.7 ලංකාපුවත් ආයතනය

ලංකාපුවත් ආයතනය ජාත්‍යන්තර පුවත් ඒන්ජන්ත ආයතනවලට සමගාමීව 1978 වර්ෂයේ ආරම්භ කරන ලද අතර 2007 අංක 07 දරන සමාගම් පනත යටතේ ලියාපදිංචි කර ඇති නෛතික පුද්ගලභාවයක් ඇති ආයතනයකි. මෙම ආයතනය ලංකාවේ විදේශීය පුවත් ඒජන්සිය (Foreign News Agency) ලෙස විදේශීය රටවල පුවත් ඒන්ජන්තවරුන් සමඟ කටයුතු කළ ද පසුගිය සිව්වසර පුරාවට මෙම ක්‍රියාවලිය අඩපණ වී ඇත. වර්තමානයේ ලංකා පුවත් ආයතනය බොහෝදුරට අක්‍රීය තත්ත්වයේ පවතින අතර මොබිටෙල් ආයතනය සමඟ ගිවිසුමකට එළඹ ඇති පරිදි කෙටි පණිවිඩ සේවාවක් (SMS Alert) පවත්වාගෙන යමින් ආයතනයේ වෙබ් අඩවියේද ප්‍රවෘත්ති යාවත්කාලීන කරනු ලැබේ. මෙම ආයතනය ආදායම් උපදවන ව්‍යාපාරික ඒකකයක් ලෙස “ලංකාපුවත්” යන නාමය ජාත්‍යන්තරය හඳුනාගැනීම සඳහා පුළුල් කිරීමට යෝජනා වී ඇත.

### 1.6.8 මහින්ද රාජපක්ෂ ජාතික ටෙලි සිනමා උද්‍යානය

මහින්ද රාජපක්ෂ ජාතික ටෙලි සිනමා උද්‍යානය වර්ෂ 2010 දී ස්ථාපිත කරන ලදී. ජාත්‍යන්තර වශයෙන් ආසියානු කලාපය තුල සිනමා කර්මාන්තයෙහි රූපගත කිරීමේ ස්ථානයක් ලෙස ජාත්‍යන්තර වශයෙන් ප්‍රචලිත ස්ථානයක් ලෙස දියුණු කිරීමේ දීර්ඝ කාලීන පරමාර්ථ පෙරදැරි කරගනිමින් දේශීය සිනමා කර්මාන්තයෙහි සංවර්ධනය සහතික කරනු වස් මෙම ටෙලි - සිනමා උද්‍යානය ස්ථාපිත කරන ලදී.

මහින්ද රාජපක්ෂ ටෙලි සිනමා උද්‍යානය නීත්‍යානුකූල ආයතනයක් ලෙස පනතනික් සංස්ථාපනය කර නොමැති අතර දැනට ජනමාධ්‍ය අමාත්‍යාංශය යටතේ අධීක්ෂණය වන ඒකකයක් ලෙස ක්‍රියාත්මක කෙරේ. මෙය විධිමත්ව ස්ථාපිත නෛතික ආයතනයක් ලෙස ස්ථාපිත කරන තුරු මෙහි කටයුතු ඉටු කර ගැනීම සඳහා පාලක මණ්ඩලයක් පත් කර ඇත. මෙම ආයතනයේ ව්‍යාපාරික කටයුතු කාර්යක්ෂම අන්දමින් හා වාණිජමය පදනමක් මත පවත්වාගෙන යාම සඳහාත් එහි සිදු කරනු ලබන ටෙලි නිෂ්පාදන කටයුතු ජාත්‍යන්තර ප්‍රමිතීන්ට අනුව උසස් තත්ත්වයකින් හා නවීන තාක්ෂණයෙන් හා පහසුකම් වලින් සමන්විත ආයතනයක් ස්ථාපිත කිරීම සඳහා යන කරුණු සම්බන්ධයෙන් අවධානය යොමු කරමින් පාලක මණ්ඩලයේද අදහස්වලට අනුව මහින්ද රාජපක්ෂ ජාතික ටෙලි සිනමා උද්‍යාන පදනම පනත මෙම අමාත්‍යාංශය මඟින් කෙටුම්පත් කර ඇත.

### 1.6.9 ශ්‍රී ලංකා ජනමාධ්‍ය අභ්‍යාස ආයතනය

රූපවාහිනී මාධ්‍ය ශ්‍රී ලංකාවේ ආරම්භවීමත් සමඟම එම මාධ්‍යට සම්බන්ධ ශිල්පීන් සහ තාක්ෂණික නිලධාරීන් පුහුණු කිරීම හා රූපවාහිනී මාධ්‍ය ක්ෂේත්‍රයට පිවිසෙන ආධුනිකයන්හට අවශ්‍ය පුහුණුව සහ දැනුම ලබා දීම අරමුණු කොට ගනිමින් 1982 වර්ෂයේදී ජර්මානු රජයේ ආධාර මත ශ්‍රී ලංකා රූපවාහිනී අභ්‍යාස ආයතනය (SLTTI) නමින් ආයතනයක් පිහිටුවන ලදී. 2010 අප්‍රේල් 30 දිනැති අංක 1651/20 දරන අතිවිශේෂ ගැසට් නිවේදනය මඟින් 2011 නොවැම්බර් 16 වන දින මෙම ආයතනය ජනමාධ්‍ය හා තොරතුරු අමාත්‍යාංශය වෙත පැවරිණි. අනතුරුව 2007 අංක 07 දරණ සමාගම් පනත යටතේ 2014 මාර්තු මස 05 වන දින ජනමාධ්‍ය විෂය සම්බන්ධ රජයේ එකම මාධ්‍ය පුහුණු ආයතනය ලෙස පුළුල්ව සංවර්ධනය කිරීමේ අරමුණින් ශ්‍රී ලංකා ජනමාධ්‍ය අභ්‍යාස ආයතනය ලෙස ජනමාධ්‍ය අමාත්‍යාංශය යටතේ වන සීමාසහිත සමාගමක් ලෙස සංස්ථාපනය කරන ලදී. ශ්‍රී ලංකා ජනමාධ්‍ය අභ්‍යාස ආයතනය රූපවාහිනී ක්ෂේත්‍රයට සම්බන්ධ ශිල්පීය හා තාක්ෂණික පුහුණුව ලබාදීමෙන් ඔබ්බට ගොස් ගුවන්විදුලි, සිනමා සහ මුද්‍රිත මාධ්‍ය ඇතුළු සෙසු මාධ්‍යයන්හි නියැළී සිටින ශිල්පීන් සඳහා පුහුණු ආයතනයක් ලෙස ක්‍රියාත්මක විය. 2019.02.26 දින 2112/13 දරණ ගැසට් පත්‍රය ප්‍රකාරව මෙම ආයතනය අමාත්‍ය මණ්ඩල සාමාජික නොවන අමාත්‍යවරයකු යටතට පමුණුවන ලද ජනමාධ්‍ය අමාත්‍යාංශයීය විෂය පථය යටතේ ලැයිස්තු ගත නොවූ අතර 2019.12.10 දින 2153/12 ගැසට් පත්‍රය ප්‍රකාරව නැවත ජනමාධ්‍ය අමාත්‍යාංශයීය විෂය පථයට ඇතුළත් කෙරිණි. දැනට මෙම ආයතනය සක්‍රීය ක්‍රියාකාරීත්වයේ නොමැති අතර ජනමාධ්‍යවේදීන් සඳහා උසස් අධ්‍යාපන ආයතනයක් ස්ථාපිත කිරීමට සුදුසු ස්ථානයක් ලෙස මෙම පරිශ්‍රය හඳුනාගෙන ඇත.

## 1.6.10 තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ කොමිෂන් සභාව

2016 අංක 12 දරණ තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනතෙහි 11 වන වගන්තිය ප්‍රකාරව තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ කොමිෂන් සභාව පොදු අධිකාරීන් සුපරීක්ෂණය කිරීමෙහි සහ තොරතුරු නීතිය බලාත්මක කිරීමේ ආයතනය වශයෙන් ස්ථාපිත කරන ලදී. ව්‍යවස්ථාපිතව ස්වාධීන ආයතනයක් වන අතර තොරතුරු පනතේ විධිවිධාන වලට අනුකූල නොවීම පිළිබඳ පැමිණිලි විභාග කිරීමේ හිමිකම ඇති අතර එහි විධිවිධාන උල්ලංඝනය කරන නිලධාරීන්ට එරෙහිව විනය ක්‍රියාමාර්ග ගැනීමෙහිලා නිර්දේශ ඉදිරිපත් කිරීමේ හැකියාව ද සහිතය. තවද පනත මගින් නිර්මිත වැරදි සිදුකරන්නවුන්ට එදිරිව නඩු පැවරීමේ බලය එයට පවතී.

පනත යටතේ පොදු අධිකාරීන් මගින් සිය රාජකාරිවලට අනුගතව කටයුතු කරන්නේදැයි ඇගයීමේ කාර්ය කොමිෂන් සභාව සතු වන අතර යම් පොදු අධිකාරියක් සඳහා අවශ්‍ය කරන්නා වූ සාමාන්‍ය ප්‍රතිසංස්කරණ මෙන්ම විශේෂිත වූ ප්‍රතිසංස්කරණද සඳහා නිර්දේශ ඉදිරිපත් කිරීමටත් තොරතුරු නිදහස් කිරීම සඳහා රාජ්‍ය ආයතන වෙත සාධාරණ ගාස්තු තීරණය කිරීම සම්බන්ධ උපදෙස් නිකුත් කිරීමටත්, නොමිලයේ තොරතුරු නිදහස් කල යුතු අවස්ථා නිර්දේශ කිරීමටත්, ගාස්තු උපලේඛනය නිර්දේශ කිරීමටත්, රජයේ නිලධාරීන් සඳහා පුහුණු වැඩසටහන් සම්බන්ධීකරණය / හැසිරවීමටත්, පනත යටතේ හිමිකම් සහ අවශ්‍යතා ප්‍රසිද්ධ කිරීමටත් එමෙන්ම රජයේ ආයතන විසින් නිසි පරිදි වාර්තා තබා ගැනීම සඳහා අවශ්‍ය වන්නාවූ උපදෙස් මාලා නිකුත් කිරීමටත් කොමිෂන් සභාව බැඳී සිටී.

පනත යටතේ අභියාචනා විභාග කිරීමටත් කොමිෂන් සභාවට බලය ඇත. මෙයට යම් පුද්ගලයකු දිවුරුමකින්/ ප්‍රතිඥාවක් මත පරීක්ෂාවට ලක් කිරීමටත් ඔහුගේ/ ඇයගේ සන්තකයෙහි පවත්නා ඕනෑම තොරතුරක් ඉදිරිපත් කිරීම එකී පුද්ගලයාගෙන් සිදුකරවීමට බලය පවතී. (විශේෂිත කරන ලද තොරතුරු පරීක්ෂණයට බඳුන් කිරීම රහස්‍යව සිදු කරනු ලැබේ). පනතින් විශේෂිත කරන ලදුව ආවරණය කරන ලද තොරතුරුද ඇතුළු ඕනෑම රාජ්‍ය ආයතනයක පවත්නා තොරතුරක් පරීක්ෂා කිරීමේ හිමිකම කොමිෂන් සභාව සතුය. යම් ආකාරයකින් තොරතුරු සැපයීම සඳහා යම් රජයේ ආයතනයකට උපදෙස් දීමට කොමිෂන් සභාවට හැකියාව ඇති අතර මහජනතාවට ඉදිරිපත් කිරීමෙන් වැලකී සිටි තොරතුරු ප්‍රකාශයට පත් කිරීමට (විශේෂිත වූ කරුණු හැර) යම් රාජ්‍ය ආයතනයක් යොමුකිරීමේ හැකියාව සහිතය. යම් තොරතුරක් ලබාදීම ප්‍රමාද කිරීම කරණ කොට ගනිමින් යම් පුරවැසියකුගෙන් අයකරන ලද යම් මුදලක් නැවත ලබාදීම සඳහා යම් රාජ්‍ය ආයතනයක් යොමු කිරීමටද කොමිෂන් සභාවට හැකියාව පවතී (15 වන වගන්තිය).

## 1.7 විදේශ මූල්‍යනය මත දිවෙන ව්‍යාපෘති පිළිබඳ තොරතුරු

1.7.1 අ) ව්‍යාපෘතියෙහි නම : ගැටුම්වලින් බලපෑමට ලක්වූ සහ ආන්තික ප්‍රජාවන්ට තොරතුරු දැනගැනීමේ සහ හිමිකම් ප්‍රවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය

ආ) ආධාර ලබා දෙන ආයතනය : ස්විස්ටර්ලන්ත රජය

ඇ) ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත පිරිවැය : රුපියල් මිලියන 4.5

ඈ) ව්‍යාපෘති කාලය : 2018 මැයි – 2019 අගෝස්තු

1.7.2 අ) ව්‍යාපෘතියෙහි නම : ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාවෙහි රූපවාහිනී වැඩසටහන් වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය

ආ) ආධාර ලබා දෙන ආයතනය : ජපාන රජය (JICA)

ඇ) ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත පිරිවැය : රුපියල් මිලියන 101.6

ඈ) ව්‍යාපෘති කාලය : 2017 – 2022

# 02 පරිච්ඡේදය

## ප්‍රගතිය හා ඉදිරි දැක්ම

## 2.1 ජයග්‍රහණ

### 2.1.1 2016 අංක 12 දරණ තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනත ක්‍රියාත්මක කිරීම

ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව විසින් 2016 අගෝස්තු මස 04 වන දින සිට බලාත්මක වූ තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනත ක්‍රියාත්මක කර එය සමාජගත කිරීම සම්බන්ධයෙන් වන වගකීම ජනමාධ්‍ය අමාත්‍යාංශය වෙත පැවරී ඇත. 2017 පෙබරවාරි මස 03 වන දින සිට මෙම පනත ක්‍රියාත්මක වීම ආරම්භ වූ අතර රජයේ නිල තොරතුරු ජනතාවට දැනගැනීමේ අයිතිය තහවුරු කිරීමෙන් රටේ ප්‍රජාතන්ත්‍රවාදය හා යහපාලන මූලධර්ම මනාව ක්‍රියාවට නැංවීමත් එමගින් දූෂණයෙන් තොර යහපත් වගකීම් සහිත රාජ්‍ය සේවාවක් ස්ථාපිත කිරීමත් තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනතෙහි මූලික පරමාර්ථය විය. මෙම පනත සමාජගත කිරීම උදෙසා 2017 වසරේ සිටම ජනමාධ්‍ය අමාත්‍යාංශය අඛණ්ඩව සක්‍රීය ලෙස දායක විය.

2019 වර්ෂයේදී තොරතුරු දැනගැනීමේ අයිතිය පිළිබඳ මනා අවබෝධයක් පුරවැසියන් වෙත ලබාදීමේ අරමුණින් "ගමට තොරතුරු අයිතිය" RTI ජංගම සේවා පවත්වා ඇති අතර මේ හරහා තොරතුරු දැනගැනීමේ අයිතිය හා එහි වැදගත්කම සහ ගැටළු සහගත තත්ත්වයන් පිළිබඳව විසඳුම් ලබාදීම සිදු විය. තොරතුරු පනත බලාත්මක වී ගතවූ වසර දෙක තුළ පනතේ ක්‍රියාකාරීත්වය සම්බන්ධයෙන් තොරතුරු නිලධාරීන්ගේ අත්දැකීම් අනුසාරයෙන් තොරතුරු නිලධාරීන් උදෙසා මාර්ගෝපදේශ සංග්‍රහයක් සකස් කර ඇත. තොරතුරු පනතට අදාල තොරතුරු ලබාගැනීමේ ඉල්ලුම්පත් විද්‍යුත් මාර්ගයෙන් ලබාගැනීම (RTI Online Tracking System) හඳුන්වා දීම සඳහා තොරතුරු පනත ප්‍රකාරව තෝරාගත් අමාත්‍යාංශ කිහිපයක ප්‍රගාමී තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් වන නියමු ව්‍යාපෘතීන් ආරම්භ කර ඇත. තොරතුරු ප්‍රගාමී ලෙස තාක්ෂණික හා ඉලෙක්ට්‍රොනික ක්‍රමවේදයකට සකස් කිරීම සඳහා උපදේශන වැඩසටහනට එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන (UNDP) අනුග්‍රහය දක්වන ලද අතර ආයතන කිහිපයක් සිය වෙබ් අඩවි නවීකරණය කර ඇත. "රට වෙනුවෙන් එකට සිටිමු" ජාතික වැඩසටහනට සමගාමීව ද රාජ්‍ය සේවය ගමට ගෙනයාමේ ජනතා සේවය විශේෂ වැඩසටහන් තුළින්ද තොරතුරු දැනගැනීමේ අයිතිය පිළිබඳ දැනුවත් කිරීම් කරන ලදී. තොරතුරු පනත පිළිබඳ පුහුණුකරුවන්ගේ සංචිතයක් පිහිටුවා ඇත. තොරතුරු පනත සම්බන්ධයෙන් ප්‍රජා නායකයින් පුහුණු කිරීමද පනතේ ඉදිරි ක්‍රියාමාර්ග සම්බන්ධයෙන් අමාත්‍යාංශ ලේකම්වරු දැනුවත් කිරීමද සිදු කර ඇත. මීට අමතරව සිවිල් ක්‍රියාකාරීන්ගේ හමුවක්ද පවත්වා ඇත. තොරතුරු පනතට අදාලව අමාත්‍යාංශය මඟින් "පවත" පුවත්පත මාසිකව ප්‍රකාශයට පත් කර ඇත. තොරතුරු පනතේ භාවිතය සම්බන්ධ දීපව්‍යාප්ත සමීක්ෂණයක් පවත්වන ලදී. 2019 සැප්තැම්බර් 15 සිට ඔක්තෝබර් 15 දක්වා කාලය "තොරතුරු මාසය" ලෙස ප්‍රකාශයට පත් කළ අතර මීට සමගාමීව වැඩසටහන් රාශියක් ක්‍රියාත්මක කරන ලදී.

### 2.1.2 රූපවාහිනී සහ ගුවන් විදුලි විකාශන බලපත්‍ර නිකුත් කිරීම නියාමනය කිරීම සඳහා විකාශන නියාමනය පිළිබඳ කොමිෂන් සභා පනත් කෙටුම්පත සකස් කිරීම

ශ්‍රී ලංකාව තුල ගුවන් විදුලි විකාශන සහ රූපවාහිනී විකාශන සිදු කිරීමේ බලය ලබා දෙනු ලබන පනත් වන්නේ 1966 අංක 37 දරණ ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථා පනත සහ 1982 අංක 06 දරණ ශ්‍රී ලංකා රූපවාහිනි සංස්ථා පනතයි. පෞද්ගලික ගුවන් විදුලි සහ රූපවාහිනී ආයතන සඳහා බලපත්‍ර නිකුත් කිරීමද මෙකී පනත් දෙකෙහි ප්‍රතිපාදන වලට යටත්ව සිදු කෙරේ.

ඒ අනුව, ජනමාධ්‍ය අමාත්‍යංශය විසින් පෞද්ගලික ගුවන් විදුලි විකාශන බලපත්‍ර 27 ක් සහ රූපවාහිනී විකාශන බලපත්‍ර 54ක් නිකුත් කොට ඇතත් වර්තමානය වන විට රූපවාහිනී විකාශන බලපත්‍ර 28ක් සහ පෞද්ගලික ගුවන්විදුලි විකාශන බලපත්‍ර 18ක් පමණක් භාවිතයේ පවතී.

එසේ නිකුත් කරන ලද බලපත්‍ර සම්බන්ධයෙන් පැවැති ගැටළු සලකා බලා ඉදිරියේදී එම බලපත්‍ර නිකුත් කිරීමේ කාර්යාවලිය හා බලපත්‍ර කොන්දේසි නියාමනය විධිමත් කිරීමේ අරමුණින් කමිටුවක් පත් කරන ලදී. එම කමිටුව විසින් බලපත්‍ර නිකුත් කිරීම සම්බන්ධ කරුණු සලකා බලා, "විකාශන නියාමන කොමිෂන් සභා පනත් කෙටුම්පත" සම්පාදනය කිරීමෙහිලා සකස් කරන ලද අවසන් වාර්තාව ඉදිරිපත් කරන ලදී.

### 2.1.3 ජනාධිපති මාධ්‍ය සම්මාන උළෙල – 2018

මහජනතාව සතුව පවත්නා තොරතුරු අයිතිවාසිකම සහතික කරන අතරතුර රටෙහි සමාජ, ආර්ථික, සංස්කෘතික සහ සංවර්ධන ඉලක්ක සාක්ෂාත් කර ගැනීම සඳහා වගකීම් සහගතව දායකත්වය සැලසීම මාධ්‍ය ප්‍රතිපත්ති තුළින් අපේක්ෂා කෙරේ. මෙකී ඉලක්ක සාක්ෂාත් කර ගැනීම සඳහා ජනමාධ්‍යයෙහි ඉහළම ප්‍රමිතීන් පවත්වා ගැනීම අත්‍යවශ්‍ය වන අතර ග්‍රාහකයන්ගේ අභිමතාර්ථයන් කෙරෙහි වගකීම් සහගතව, ස්වාධීනව සහ සංවේදීව විද්‍යුත්, මුද්‍රිත සහ වෙබ් මාධ්‍ය අන්තර්ගතයන් පවත්වාගෙන යාම සඳහා මාධ්‍යවේදීන් දිරිගැන්විය යුතුය. ඒඅනුව, ජනමාධ්‍ය අමාත්‍යංශය විසින් ජනාධිපති මාධ්‍ය සම්මාන උළෙලක් පැවැත්වීමෙහි අවශ්‍යතාවය හඳුනාගනිමින් රට තුල විශිෂ්ඨ මාධ්‍ය සම්ප්‍රදායක් / සංස්කෘතියක් බිහිකිරීමෙහි ලා ශ්‍රී ලාංකේය මාධ්‍ය පෞරුෂයන් විසින් සිදු කරන ලද කාර්යසාධනය සහ දායකත්වය ඇගයීම පිණිස 2019 අප්‍රේල් මස බණ්ඩාරනායක අනුස්මරණ ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාවේදී සම්මාන ප්‍රදානෝත්සවය සාර්ථකව පවත්වන ලදී.

### 2.1.4 "ඇසිදිසි" ජනමාධ්‍ය ශිෂ්‍යත්ව වැඩසටහන

ජනමාධ්‍යවේදීන්ගේ වෘත්තීයභාවය වැඩිදියුණු කිරීම අරමුණු ආරම්භ කරන ලද මෙම වැඩසටහනින් දිවයිනේ පිළිගත් ජනමාධ්‍ය ආයතනයන්හි සේවයේ නියුතු මාධ්‍ය වෘත්තිකයන්ට උසස් අධ්‍යාපන කටයුතු සඳහා අවශ්‍ය මූල්‍ය පහසුකම් සපයා ඇත. 2019 වර්ෂය සඳහා ජනමාධ්‍යවේදීන් 109 කට ශිෂ්‍යත්ව ලබාදී ඇත. මහා භාණ්ඩාගාරයෙන් ප්‍රතිපාදන ලෙස රු.මි. 5 ක් ලබාදී ඇති අතර එමගින් ශිෂ්‍යත්වලාභීන් සඳහා ගෙවීම් සිදුකර ඇත.

### 2.1.5 ආනයනය කරන ලද ටෙලි නාට්‍ය, චිත්‍රපට හා වාණිජ බද්ද වැඩසටහන් සඳහා බදු අයකිරීම

මෙම අමාත්‍යාංශය මඟින් 2016 අංක 11 දරන මුදල් පනත මඟින් පනවා ඇති නියෝගයන්ට අනුව රූපවාහිනී නාලිකා මඟින් විකාශනය කරනු ලබන ආනයනික වැඩසටහන් සඳහා බදු අය කෙරේ.

2019 වර්ෂයේ ආනයනික ටෙලි නාට්‍ය, චිත්‍රපට හා වාණිජ වැඩසටහන් 5296 ක් සඳහා නිශ්කාෂණ සහතිකපත් නිකුත් කර ඇති අතර අයකරගනු ලැබූ බදු මුදල රු.මි. 687.10 කි. මෙම කාර්යය සඳහා සමීක්ෂණ මණ්ඩල සාමාජිකයන් 21 දෙනෙකු සම්බන්ධ කර ඇති අතර දෛනිකව තිදෙනා බැගින් වන අනු කමිටු වාර 321 ක් මඟින් විකාශන අනුමැතීන් ලබාදී ඇත.

### 2.1.6 පණ්ඩිත් අමරදේව අසපුව ස්ථාපිත කිරීම

මෙම ව්‍යාපෘතියේ ඉදිකිරීම් කටයුතු රජයේ විධිමත් ප්‍රසම්පාදන ක්‍රියාවලියට අනුව තෝරාගන්නා ලද ආයතනයක් වෙත ප්‍රදානය කරන ලද මුත් එම ඉදිකිරීම් සම්බන්ධව සෑහීමකට පත්වීමට නොහැකි වූ බැවින් උපදේශන ආයතනය වන ඉංජිනේරුමය කාර්යයන් පිළිබඳ මධ්‍යම උපදේශන කාර්‍යාංශයේ උපදෙස් අනුව කොන්ත්‍රාත් ගිවිසුම අවසන් කිරීමට තීරණය කරන ලද අතර ඉදිරියේදී විධිමත් ප්‍රසම්පාදන ක්‍රමවේදයක් භාවිතා කරමින් වෙනත් ඉදිකිරීම් ආයතනයක් වෙතින් ඉදිරි කටයුතු සිදුකර ගැනීමට අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබී ඇත.

### 2.1.7 මහින්ද රාජපක්ෂ ජාතික ටෙලි සිනමා උද්‍යානය

යටිතල පහසුකම් සංවර්ධන කටයුතු හා පරිසර හිතකාමී සංවර්ධන කටයුතු සිදු කර ඇත. 2019 වර්ෂයේදී **ටෙලි සිනමා උද්‍යානය** රුපියල් මිලියන 9.145 ක ආදායමක් උපයාගෙන ඇත.

### 2.1.8 මහාභාණ්ඩාගාර ප්‍රතිපාදන ලබාදී ඇති ආයතන විසින් ක්‍රියාත්මක කරන ලද ව්‍යාපෘතීන්හි ප්‍රගතිය

#### 2.1.8.1 ස්වාධීන රූපවාහිනී මාධ්‍ය ජාලය

වසන්තම් ටීවී නාලිකාව මෙරට දමිළ භාෂාව කතා කරන ශ්‍රී ලාංකික ජනතාව වෙත සුපැහැදිලි දසුන් නැරඹීමට හා දේශීය දමිළ වැඩසටහන් නිෂ්පාදනය කර විකාශනය කිරීමට හැකිවන පරිදි වැඩිදියුණු කිරීමේ ද්විවාර්ෂික ව්‍යාපෘතියෙහි මුළු ඇස්තමේන්තු මුදල රු.මි. 304 කි. 2019 වසර තුල යාපනය සම්ප්‍රේෂණ මධ්‍යස්ථානය වැඩිදියුණු කිරීම මගින් ආවරණ කලාපය වැඩිකර ගැනීමට හැකි විය. 2019 වසර තුල අපේක්ෂිත අරමුදල් නොලැබීම හේතුවෙන් ව්‍යාපෘති කාලය වසර 3ක් දක්වා දීර්ඝ කිරීමට සිදුවිය.

#### 2.1.8.2 ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාව

මැදිරි නිෂ්පාදන හා ප්‍රවෘත්ති මැදිරියන්හි කාර්ය ගලනයේ ගුණාත්මකභාවය, නම්‍යශීලීත්වය හා පිරිවැය කාර්යක්ෂමතාවය ඉහළ නැංවීම, බාහිර විකාශනාගාර මෙහෙයුම්වල ගුණාත්මකතාවය හා කාර්යක්ෂමතාවය ඉහළ නැංවීම, රූපවාහිනී නාලිකාවල භෞමික විකාශනය වැඩිදියුණු කිරීම, නවමාධ්‍ය භාවිතය ඉහළ නැංවීම හා තොරතුරු තාක්ෂණ යටිතල පහසුකම් ප්‍රවර්ධනය සහ රූපවාහිනී විකාශය වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘති මෙම වසර තුළ දියත් කර ඇත.

රූපවාහිනී වැඩසටහන් වැඩිදියුණු කිරීම සඳහා ජපන් සංස්කෘතික භුවමාරු වැඩසටහන යටතේ ලද ජපන් අධ්‍යාපනික සහ වාර්තාමය වැඩසටහන් 449 ක් ශ්‍රී ලාංකේය ප්‍රේක්ෂකයන් සඳහා සිංහල සහ දමිල භාෂාවන්ගෙන් හඬකැවීම්/උපශීර්ෂ ගැන්වීම් සිදුකර විකාශනය අරඹන ලදී. ප්‍රතිපාර්ශවීය අරමුදලින් සිදුකිරීමට නියමිතව තිබූ කාර්යයන් නිම කර ඇත.

#### 2.1.8.3 ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාව

යාල් FM සේවය සඳහා මැදිරි සංකීර්ණයක් ස්ථාපිත කිරීමේ මූලික කටයුතු ආරම්භ කර ඇත. සම්බන්ධතා මැදිරි හා බහුකාර්ය මැදිරි යාවත්කාලීන කිරීමේ කටයුතු, විකාශනාගාර අලුත්වැඩියා කිරීමේ කටයුතු හා පරිගණක ජාල ව්‍යාපෘතිය ස්ථාපිත කිරීමේ කටයුතු නිම කර ඇත.

#### 2.1.8.4 තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ කොමිෂන් සභාව

2019 වර්ෂය තුළදී කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කරන ලද මහජන පැමිණිලි 1089 න් පැමිණිලි 709 ක් එනම් 65% ක් සම්බන්ධයෙන් කටයුතු අවසන් කර ඇත. ස්විස්ටර්ලන්ත රජයේ ආධාර ඇතිව ගැටුම්වලින් බලපෑමට ලක්වූ සහ ආන්තික ප්‍රජාවන්ට තොරතුරු දැනගැනීමේ සහ හිමිකම් ප්‍රවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය යටතේ ප්‍රකාශන 07 ක් එළි දක්වන ලදී. තවද තෝරාගත් දිස්ත්‍රික්කවල ආන්තික ප්‍රජාවන් සහ තොරතුරු නිලධාරීන් සඳහා පළාත් උපදේශන අවස්ථා සහ අභියාචනා සම්බන්ධයෙන් පසිඳලීමේ නියුතුවීම්වලටද අවතීර්ණ වන ලදී. සිවිල් සමාජ සංවිධාන, ප්‍රජාපාදක සංවිධානයන්හි සාමාජිකයින් සහ රාජ්‍ය නිලධාරීන්ගේ සහභාගීත්වයෙන් දිස්ත්‍රික්ක 07 ක මහජනතාව දැනුවත් කිරීමේ වැඩසටහන් යටතේ පලාත් උපදේශන සහ අභියාචනා විභාග කිරීමේ වැඩමුළු පවත්වන ලදී.

#### 2.1.8.5 ශ්‍රී ලංකා පුවත්පත් මණ්ඩලය

පුවත්පත් ලියාපදිංචිය, පුවත්පත් පැමිණිලි විභාග කිරීම, ප්‍රාදේශීය මාධ්‍යවේදී වැඩමුළු පැවැත්වීම, සිසුන් හා ගුරුවරුන් සඳහා වැඩමුළු පැවැත්වීම පුවත්පත් කලාව පිළිබඳව ඩිප්ලෝමා පාඨමාලාව පවත්වාගෙන යාමට අමතරව 2019 වසරේ දී පුවත්පත් කලාව පිළිබඳ නව සහතික පත්‍ර පාඨමාලාව ආරම්භ කිරීම, සන්නිවේදන අධ්‍යයන පාරිභාෂිත ශබ්දමාලාව එළිදැක්වීම සිදුකරන ලදී.

## 2.2 අභියෝග

### 2.2.1 ශ්‍රී ලංකාවේ රූපවාහිනී විකාශන කටයුතු සඳහා අංකිත (Digital) තාක්ෂණය හඳුන්වා දීම

ශ්‍රී ලංකාවේ දැනට ක්‍රියාත්මක වන ප්‍රතිසම (Analogue) තාක්ෂණය වෙනුවට ලෝකයේ බොහෝ රටවල් විසින් නව තාක්ෂණික තත්ත්වයන් යටතේ වැඩිදියුණු කරන ලද ඩිජිටල් තාක්ෂණය රූපවාහිනී ක්ෂේත්‍රය සඳහා හඳුන්වාදීම කාලීන අවශ්‍යතාවයක් වී ඇත. විශේෂයෙන්ම ප්‍රතිසම තාක්ෂණය ඉවත් වෙමින් පැවතීම නිසා එකී තාක්ෂණය මත පවත්නා විකාශන උපකරණ ඉදිරියේදී නඩත්තු කිරීම ගැටළු සහගතවේ. තවද අංකිත තාක්ෂණය හඳුන්වා දීම මඟින් නව සංඛ්‍යාත පරාසයන් වඩා කාර්යක්ෂම ලෙස භාවිතා කිරීමට ඉඩ ලැබෙන අතර ප්‍රතිසම ක්‍රමයට සම්ප්‍රේෂණය කරනු ලබන රූපවාහිනී නාලිකාවන් සඳහා අවශ්‍ය වන සංඛ්‍යාත පරාසයන් තුළින් ඩිජිටල් තාක්ෂණය ඔස්සේ රූපවාහිනී නාලිකා වැඩි සංඛ්‍යාවක් විකාශනය කිරීමට හැකියාව ලැබෙන බැවින් මෙහෙයුම් පිරිවැය ද විශාල වශයෙන් අඩුවේ.

### 2.2.2 ජනමාධ්‍යවේදීන්ගේ වෘත්තීයභාවය ඉහල නැංවීම

වර්තමානයේදී, ආර්ථික, සමාජීය සහ දේශපාලනික භූමිකාවන්හි ඉතාම ශක්තිමත් හා තීරණාත්මක සාධකයක් බවට ජනමාධ්‍ය පත්ව තිබේ. ජනතාව වෙත තොරතුරු සමීප කරලීම පිණිස ජනමාධ්‍ය ධනාත්මක දායකත්වයක් සපයන අතර එමඟින් යහ පාලනය පවත්වාගෙන යාමට සහාය වේ.

ශ්‍රී ලංකාවෙහි ප්‍රජාතන්ත්‍රවාදය සුරැකීම සහතික කිරීමේදී නිදහස්, ස්වාධීන සහ ජනතා හිතකාමී මාධ්‍ය සංස්කෘතියක් ගොඩනැගීම වැදගත් වේ. මෙකී කර්තව්‍යය උදෙසා, යහ පාලනයත් ප්‍රජාතාන්ත්‍රවාදයත් පිළිබඳ ක්‍රියාවලිය ශක්තිමත් කිරීමෙහිලා ජනමාධ්‍යවේදීන්ගේ පාර්ශවයෙන් විශාල දායකත්වයක් අපේක්ෂා කෙරෙන අතර එබැවින්, රට තුල බහුත්ව සහ විවෘත මාධ්‍ය සංස්කෘතියක් ස්ථාපිත කිරීම සඳහා වෘත්තීය වශයෙන් බලගැන්වුනු ජනමාධ්‍යවේදී ප්‍රජාවක් පැවතිය යුතුය. පසුගිය දශක දෙක පුරාම, වෘත්තීය මාධ්‍යවේදීන් ජනිත කිරීමේ ආයතනයක් ස්ථාපිත කිරීමේ ප්‍රයත්නය සාර්ථක වී නොමැත.

ජනමාධ්‍ය සමාජයට වගකිවයුතු වන නිසාම, ඉහළම මාධ්‍ය ප්‍රමිතීන් පවත්වාගෙන යාම සහතික කරමින් අදාළ මාධ්‍ය ආචාර ධර්මයන්ට අනුකූලව වෘත්තීය මාධ්‍යවේදීන් බිහිකිරීම මගින් අත්‍යන්ත මාධ්‍ය භාවිතයේ විශිෂ්ටත්වය සාක්ෂාත්කර ගැනීමේ සමාජ වගකීම ඉටුකරන ජාතික ආයතනයක් පිහිටුවීමට යෝජනා කෙරේ.

නවීන තාක්‍ෂණයේ දියුණුව හා ගෝලීය ප්‍රවණතා හේතුවෙන් ජනමාධ්‍ය ක්‍ෂේත්‍රයේ නිරන්තර වෙනස්කම් සිදු වෙමින් පවතින අතර, එවැනි වෙනස්කම් සිදු කිරීමේදී වෘත්තීය සංවර්ධනය, ධාරිතාව ඉහළ නැංවීම සහ කුසලතා වැඩි දියුණු කිරීම සඳහා අඛණ්ඩ අධ්‍යාපන ආයතනයක් ස්ථාපිත කිරීමේ අවශ්‍යතාවය පැන නැගී ඇත. ඒ අනුව, යෝජිත මාධ්‍ය ආයතනය පිහිටුවීම අතිශයින් වැදගත් වේ.

### 2.2.3 අපක්ෂපාතී විකාශන ශ්‍රේණිගත කිරීමේ ක්‍රමවේදයක් හඳුන්වා දීම

ගුවන් විදුලි හා දැන්වීම් ප්‍රචාරයේදී විකාශන ශ්‍රේණිගත කිරීම තීරණාත්මක සාධකයක් ලෙස බලපාන්නේ මහා පරිමාණ දැන්වීම් ප්‍රචාරක ආයතන සඳහාය. විකාශන මධ්‍යස්ථානයන්හි වැඩසටහන් පෙළගැස්මේ සිට අන්තර්ගතයන් දක්වා බලපෑමකට ලක් කර ආර්ථික ශක්‍යතාවය අසමානුපාතික ලෙස පාලනය කිරීමේ හැකියාවක් ශ්‍රේණිගත කිරීම් දත්තවලට ඇත. රාජ්‍ය ගුවන් විදුලි හා රූපවාහිනී නාලිකා පමණක් ක්‍රියාත්මකව තිබූ අවධියේ ශ්‍රේණිගත කිරීම් සිදු නොවූ අතර විකාශන ක්ෂේත්‍රයේ සීමා ලිහිල් කිරීමෙන් අනතුරුව පෞද්ගලික සමාගම්වලට ඉඩ ප්‍රස්ථාව ලබාදී වසර කිහිපයකට පසුව ශ්‍රේණිගත කිරීම ආරම්භ විය. දැන්වීම්කරුවන් විසින් ශ්‍රේණිගත කිරීම් පුළුල් ලෙස භාවිතා කළද ඇතැම් විකාශන ආයතන මෙම ක්‍රමවේදය පිළිබඳව තෘප්තිමත් නැත. එබැවින් මෙම අමාත්‍යංශය මඟින් අපක්ෂපාතී ශ්‍රේණිගත කිරීම් ක්‍රමවේදයක් හඳුන්වා දිය යුතු වේ.

### 2.2.4 විකාශන නියාමන පනත හඳුන්වාදීම

තාක්ෂණික සහ නෛතික ස්ථරයන්හි සිදුවෙමින් පවත්නා වූ වෙනස්කම්, බලපත්‍ර නිකුත් කිරීමේ දී වර්තමානයේ පවතින යාන්ත්‍රණයෙහි පවත්නා අවිධිමත්භාවය, නිකුත් කරන ලද බලපත්‍රයන්හි පවත්නා ගැටළුකාරීභාවය මෙන්ම අතීතයේදී යම් අවස්ථාවන්හිදී මාධ්‍ය වල හැසිරීම පාදක කොට ගනිමින් රාජ්‍ය හෝ පුද්ගලික යන මාධ්‍ය ආයතන දෙපාර්ශවයම හැසිරවීම උදෙසා යම් ස්වාධීන ආයතනයක් පැවතිය යුතු බවට නිරීක්ෂණය විය.

## 2.3 අනාගත ඉලක්ක

i) මාධ්‍ය නිදහස තහවුරුවන පරිදි වගකීම් හා වගවීම් සහිත මාධ්‍ය සදාචාරයක් බිහිකිරීම සඳහා අවශ්‍ය නියාමනයන් ක්‍රියාත්මක කිරීම.

ii) රටේ සියළු පුරවැසියන්ට තොරතුරු ලබාගැනීමේ ප්‍රවේශයන් පුළුල් කිරීම.

iii) මාධ්‍ය වේදීන් දැනුමෙන් හා අත්දැකීමෙන් සන්නද්ධ කිරීම.



..................................................

ලේකම්
තොරතුරු හා ජනමාධ්‍ය අමාත්‍යාංශය

ඩබ්. ඒ. චූලානන්ද පෙරේරා
ලේකම්
තොරතුරු සහ ජනමාධ්‍ය අමාත්‍යාංශය
නො. 163, ඇසිදිසි මැදුර, කිරුළපන මාවත,
පොල්හේන්ගොඩ, කොළඹ 05.
නිල මුද්‍රාව

2020.07.07

# 03 පරිච්ඡේදය

## 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වසර සඳහා වන සමස්ත මූල්‍ය කාර්යසාධනය

## 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වසර සඳහා වන සමස්ත මූල්‍ය කාර්ය සාධනය

### 3.1 මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය

ඒසීඒ - එෆ්

**2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ කාල සීමාව සඳහා වන මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය**

| අයවැය 2019 | | සටහන | තත්‍ය 2019 (රු.) | 2018 (රු.) | |
|---|---|---|---|---|---|
| - | **ආදායම් ලැබීම්** | | | | |
| - | ආදායම් බදු | 1 | 615,000,272 | - | ඒසීඒ-1 |
| - | දේශීය භාණ්ඩ හා සේවා මත බදු | 2 | - | - | |
| - | ජාත්‍යන්තර වෙළඳාම මත බදු | 3 | - | - | |
| - | බදු නොවන ආදායම් හා වෙනත් | 4 | - | - | |
| - | **මුළු ආදායම් ලැබීම් (අ)** | | 615,000,272 | - | |
| - | **ආදායම් නොවන ලැබීම්** | | | | |
| - | භාණ්ඩාගාර අග්‍රිම | | 190,255,000 | | ඒසීඒ-3 |
| - | තැන්පතු | | 8,670,154 | | ඒසීඒ-4 |
| - | අත්තිකාරම් ගිණුම් | | 8,319,728 | | ඒසීඒ-5/5(ඒ)/5/(බී) |
| - | වෙනත් ලැබීම් | | 3,458,281 | | |
| - | **මුළු ආදායම් නොවන ලැබීම් (ආ)** | | **210,703,163** | | |
| - | **මුළු ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් ඇ = (අ) + (ආ)** | | **825,703,435** | | |
| | **අඩු කළා : වියදම්** | | | | |
| - | **පුනරාවර්තන වියදම්** | | | | ඒසීඒ-2(ii) |
| | වැටුප්, වේතන සහ අනෙකුත් සේවක ප්‍රතිලාභ | 5 | 72,204,327 | | |
| | අනෙකුත් භාණ්ඩ හා සේවා | 6 | 94,938,853 | | |
| | සහනාධාර, ප්‍රදාන සහ මාරු කිරීම් | 7 | 431,030,954 | | |
| - | පොළී ගෙවීම් | 8 | | | |
| - | වෙනත් පුනරාවර්තන වියදම් | 9 | | | |
| | **මුළු පුනරාවර්තන වියදම් (ඇ)** | | **598,174,134** | | |

| | | | | | |
|---|---|---|---|---|---|
| | **මූලධන වියදම්** | | | | |
| | මූලධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩි දියුණු කිරීම | 10 | 4,217,429 | | ඒසීඒ-2(ii) |
| | මූලධන වත්කම් අත්පත් කර ගැනීම | 11 | 3,465,800 | | |
| | ප්‍රාග්ධන මාරු කිරීම් | 12 | 308,623,510 | | |
| | මූල්‍ය වත්කම් අත්පත් කර ගැනීම | 13 | - | | |
| | හැකියා වර්ධනය | 14 | 11,481,319 | | |
| | වෙනත් මූලධන වියදම් | 15 | 18,469,586 | | |
| | **මුළු මූලධන වියදම් (ඉ)** | | **346,257,644** | | |
| - | ප්‍රධාන ලෙජර් වියදම් (ඊ) | | **-** | | |
| - | තැන්පතු ගෙවීම් | | 1,159,311 | | ඒසීඒ-4 |
| - | අත්තිකාරම් ගෙවීම් | | 10,810,183 | | ඒසීඒ-5/5(ඒ)/5(බී) |
| - | මුළු වියදම් උ = (ඈ+ඉ+ඊ) | | 956,401,272 | | |
| - | 2019 දෙසැම්බර් 31 දිනට අග්‍රිම ශේෂය ඌ = (ඈ-උ) | | **(130,697,837)** | | |

## 3.2 මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශය

ඒසීඒ-පී

**2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය**

| | | තත්‍ය | |
|---|---|---|---|
| | සටහන | **2019 (රු.)** | **2018 (රු.)** |
| **මූල්‍ය නොවන වත්කම්** | | | |
| දේපළ, පිරියත හා උපකරණ | ඒසීඒ-6 | 11,734,358 | |
| **මූල්‍ය වත්කම්** | | | |
| අත්තිකාරම් ගිණුම් | ඒසීඒ-5/5(ඒ) | 20,462,589 | |
| මුදල් හා මුදල් සමාන දෑ | ඒසීඒ-3 | 261,903 | |
| **මුළු වත්කම්** | | **32,458,850** | |

| | | |
|---|---|---|
| **ශුද්ධ වත්කම් / ස්කන්ධය** | | |
| ශුද්ධ වත්කම් | | 10,045,674 |
| දේපළ පිරියත හා උපකරණ සංචිතය | | 11,734,358 |
| කුලී හා වැඩ අත්තිකාරම් සංචිතය | ඒසීඒ-5(බී) | - |
| | | |
| **ජංගම වගකීම්** | | |
| තැන්පතු ගිණුම | ඒසීඒ-4 | 10,416,915 |
| අග්‍රිම ශේෂය | ඒසීඒ-3 | 261,903 |
| **මුළු වගකීම්** | | **32,458,850** |

පිටු අංක 05 සිට 53 දක්වා ඒසීඒ 1-6 දක්වා වූ ආකෘති පත්‍රවලින් ඉදිරිපත් කෙරෙන ගිණුම් තොරතුරු සහ සටහන් පිටු අංක 54 සිට 61 දක්වා ඇතුළත් ගිණුම් සටහන් විස්තර ද මෙම අවසන් ගිණුමෙහිම අන්තර්ගත කොටස් වේ. මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම පොදුවේ පිළිගත් ගිණුම් මූලධර්මවලට අනුකූලව සිදු කර ඇති අතර මෙහිදී මූල්‍ය ප්‍රකාශයන්හි සටහන් මගින් හෙළිදරව් කර ඇති පරිදි වඩාත් සුදුසු ගිණුම්කරණ ප්‍රතිපත්ති භාවිතා කර ඇත. ඉහත අවසන් ගිණුමෙහි සඳහන් සංඛ්‍යා ඊට අදාළ ගිණුම් සටහන් හා අනෙකුත් ගිණුම් තොරතුරු භාණ්ඩාගාර ගිණුම් පොත් සමඟ සැසඳීම කර ඇති බවටත්, ඒවා එම සංඛ්‍යා සමඟ එකඟ වන බවටත් මෙයින් සහතික කරමු.

..................................
ප්‍රධාන ගණන් දීමේ නිලධාරි
ඩබ්ලිව්.ඒ.චූලානන්ද පෙරේරා
ලේකම්
තොරතුරු සහ ජනමාධ්‍ය
අමාත්‍යාංශය

ඩබ්. ඒ. චූලානන්ද පෙරේරා
ලේකම්
තොරතුරු සහ ජනමාධ්‍ය අමාත්‍යාංශය
නො. 163, ඇසිදිසි මැදුර, කිරුළපන මාවත,
පොල්හේන්ගොඩ, කොළඹ 05.

..................................
ගණන් දීමේ නිලධාරි
එස්.ආර්.ඩබ්.එම්.ආර්.පී. සත්කුමාර
අතිරේක ලේකම් (පාලන)

එස්.ආර්.ඩබ්ලිව්.එම්.ආර්.පී.සත්කුමාර
අතිරේක ලේකම් (පාලන)
තොරතුරු සහ ජනමාධ්‍ය
නො. 163, ඇසිදිසි මැදුර, කිරුළපන මාවත,
පොල්හේන්ගොඩ, කොළඹ 05.

..................................
ප්‍රධාන ගණකාධිකාරී
එස්.ඒ.එන්.ආර්.සුබසිංහ

එස්.ඒ.එන්.ආර්. සුබසිංහ
ප්‍රධාන ගණකාධිකාරී
තොරතුරු සහ ජනමාධ්‍ය අමාත්‍යාංශය
අංක. 163, "ඇසිදිසි මැදුර" කිරුළපන මාවත,
පොල්හේන්ගොඩ, කොළඹ 05.

2020.07.07

## 3.3 මුදල් ප්‍රවාහ පිළිබඳ ප්‍රකාශය

**ජ්සීඒ-සී**

**2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් මාස අට සඳහා වන මුදල් ප්‍රවාහ පිළිබඳ ප්‍රකාශය**

| | තතාය | |
|---|---|---|
| | **2019 (රු.)** | **218 (රු.)** |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්** | | |
| මුළු බදු ලැබීම් | 400,994,577 | - |
| ගාස්තු, අධිභාර, දඩ මුදල් සහ බලපත්‍ර | - | - |
| ලාභ | - | - |
| ආදායම් නොවන ලැබීම් | - | |
| වෙනත් ශීර්ෂ වෙනුවෙන් එකතු කරන ලද ආදායම් | 3,458,281 | - |
| අග්‍රිම ලැබීම් | 190,255,000 | - |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (අ)** | **594,707,858** | |
| **අඩු කළා - මුදල් වැය කිරීම්** | | |
| පුද්ගල පඩිනඩි හා මෙහෙයුම් වියදම් | 149,658,949 | |
| සහනාධාර සහ මාරු කිරීම් වියදම් | 1,213,165 | |
| වෙනත් වැය ශීර්ෂ වෙනුවෙන් දරන ලද වියදම් | 160,259 | - |
| භාණ්ඩාගාරයට පියවන ලද අග්‍රිම | 401,930,186 | - |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුදල් ප්‍රවාහය (ආ)** | **552,962,559** | |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය ඇ = (අ)– (ආ)** | **41,745,299** | |
| **ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්** | | |
| පොළී | - | - |
| ලාභාංශ | - | - |
| හිමිකම් ඉවත් වීමේ ප්‍රතිපාදන හා භෞතික වත්කම් විකිණීම | - | - |
| උපණය අය කර ගැනීම | - | |
| අත්තිකාරම් අය කර ගැනීම | 3,435,521 | |
| **ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඇ)** | **3,435,521** | |

| | | |
|---|---|---|
| <u>**අඩු කළා - මුදල් වැය කිරීම් :**</u> | | |
| භෞතික වත්කම් ඉදිකිරීම් හෝ මිලදී ගැනීම් හා වෙනත් | 51,149,399 | |
| ආයෝජන අත්පත් කර ගැනීම් | | |
| අත්තිකාරම් ගෙවීම් | 3,494,165 | |
| **ආයෝජන ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය(ඉ)** | **54,643,564** | |
| **ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඊ) = (ඈ) + (ඉ)** | **(51,208,043)** | |
| **මෙහෙයුම් හා ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය(උ) = (ඈ) + (ඊ)** | **(9,462,744)** | |
| <u>**මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්**</u> | | |
| දේශීය ණය ගැනීම් | - | - |
| විදේශීය ණය ගැනීම් | - | - |
| ප්‍රදානයන් ලැබීම් | - | - |
| තැන්පතු ලැබීම් | 8,485,584 | |
| **මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුළු මුදල් ප්‍රවාහය (ඌ)** | **8,485,584** | |
| <u>**අඩු කළා - මුදල් වැය කිරීම් :**</u> | | |
| දේශීය ණය ආපසු ගෙවීම් | - | |
| විදේශීය ණය ආපසු ගෙවීම් | - | |
| තැන්පතු ගෙවීම් | 747,681 | |
| **මූල්‍ය ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (එ)** | **747,681** | |
| **මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (එ්)= (ඌ)–(එ)** | **7,737,903** | |
| **මුදල්වල ශුද්ධ වෙනස් වීම් (ඔ) = (උ) – (ඒ)** | **(1,724,841)** | **-** |
| **මැයි 01 දිනට ආරම්භක මුදල් ශේෂය** | 1,986,744 | - |
| **දෙසැම්බර් 31 දිනට අවසාන මුදල් ශේෂය** | **261,903** | **-** |

## 3.4 මූල්‍ය ප්‍රකාශ සටහන්

2018 වසරේ ජනමාධ්‍ය අංශය, ශීර්ෂ අංක 102 - මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යාංශය යටතේ උප කාර්යාලයක් ලෙස පවත්වාගෙන ගිය බැවින් 2018 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශ පිලියෙල කිරීම, මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යාංශය මගින් සිදු කරන ලදී. එබැවින් 2018 වර්ෂය සඳහා වන ගිණුම් මෙයට ඇතුළත් කර නොමැත.

<u>වාර්තා කිරීමේ පදනම</u>

**(1)** <u>වාර්තාකරන කාල පරිච්ඡේදය</u>

2019 ජනවාරි 01 සිට දෙසැම්බර් 31 දක්වා වූ කාල පරිච්ඡේදය මෙම මූල්‍ය ප්‍රකාශයන්ට අදාළ වාර්තාකරන කාල පරිච්ඡේදය වේ.

**(2)** <u>මිනුම්කරණ පදනම</u>

මූල්‍ය ප්‍රකාශන ඓතිහාසික පිරිවැය මත පිළියෙළ කර ඇති අතර සමහර වත්කම්වල ඓතිහාසික පිරිවැය නැවත තක්සේරු කරන ලද වටිනාකමට වැඩිදියුණු කර ඇත. අන්‍යාකාරයෙන් දක්වා නොමැති විට ගිණුම් පිළියෙළ කිරීම වැඩිදියුණු කළ මුදල් පදනම මත සිදු කරයි.

**(3)** <u>ආදායම් හඳුනා ගැනීම</u>

හුවමාරු හා හුවමාරු නොවන ආදායම් ඒවා ලැබිය යුතු කාල සීමාව නොසළකා, මුදල් ලැබෙන කාල පරිච්ඡේදයේදී ආදායම් ලෙස හඳුනාගනු ලැබේ.

**(4)** <u>දේපළ, පිරියත හා උපකරණ හඳුනාගැනීම හා මැනීම</u>

වත්කමට අදාළ අනාගත ආර්ථික ප්‍රතිලාභ ආයතනයට ලැබෙන බවට තහවුරුවක් ඇති විට හා එම වත්කම් විශ්වාසනීයව මැනිය හැකි නම්, එම වත්කම්, දේපළ, පිරියත හා උපකරණ ලෙස හඳුනාගනු ලැබේ.

දේපළ, පිරියත හා උපකරණ පිරිවැයට හඳුනා ගන්නා අතර පිරිවැය ආකෘතිය අදාළ නොවන අවස්ථාවලදී නැවත තක්සේරු කරන ලද අගය යොදා ගනී.

**(5)** <u>දේපළ, පිරියත හා උපකරණ සංචිතය</u>

මෙම සංචිත ගිණුම දේපළ, පිරියත හා උපකරණවල අනුරූප ගිණුම වේ.

**(6)** <u>මුදල් හා මුදල් සමාන දෑ</u>

2019 දෙසැම්බර් 31 දිනට අතැති දේශීය ව්‍යාවහාර මුදල් නෝට්ටු සහ කාසිවලින් මුදල් හා මුදල් සමාන දෑ සමන්විත වේ.

## 3.5 ආදායම් එකතු කිරීමේ කාර්ය සාධනය

රු.,000

| ආදායම් කේතය | ආදායම් කේතයේ විස්තරය | ආදායම් ඇස්තමේන්තුව | | එකතු කරන ලද ආදායම | |
|---|---|---|---|---|---|
| | | මුදල් ඇස්තමේන්තුව | අවසන් ඇස්තමේන්තුව | ප්‍රමාණය | අවසාන ආදායම් ඇස්තමේන්තුවේ % ලෙස |
| 1002-13-00 | ආනයනික ටෙලි නාට්‍ය, චිත්‍රපට හා වෙළඳ දැන්වීම් සඳහා අයකරන බද්ද | 600,000 | 600,000 | 615,000 | 103 |

## 3.6 වෙන් කරන ලද ප්‍රතිපාදන උපයෝගි කර ගැනීමේ කාර්ය සාධනය

රු.,000

| ප්‍රතිපාදන වර්ගය | වෙන් කරන ලද ප්‍රතිපාදන | | තත්‍ය වියදම | උපයෝගී කරනු ලැබූ ප්‍රතිපාදන, අවසන් කරන ලද අවසාන ප්‍රතිපාදන ප්‍රමාණයේ % ලෙස |
|---|---|---|---|---|
| | මුදල් ප්‍රතිපාදනය | අවසාන ප්‍රතිපාදනය | | |
| පුනරාවර්තන | 612,350 | 642,950 | 598,174 | 93 |
| ප්‍රාග්ධන | 788,450 | 793,510 | 346,258 | 43 |
| එකතුව | 1,400,800 | 1,436,460 | 944,432 | 65 |

### 3.7 මු.රෙ.208 ප්‍රකාරව, වෙනත් අමාත්‍යාංශ/ දෙපාර්තමේන්තුවල නියෝජිතයෙකු ලෙස මෙම අමාත්‍යාංශයට ප්‍රදානය කරන ලද ප්‍රතිපාදන

රු. ,000

| අනු අංකය | ප්‍රතිපාදන ලද අමාත්‍යාංශය/ දෙපාර්තමේන්තුව | ප්‍රතිපාදනයේ අරමුණ | ප්‍රතිපාදන | | තත්‍ය වියදම | උපයෝගී කර ගන්නා ලද ප්‍රතිපාදන, ලබා දුන් අවසාන ප්‍රතිපාදනවල % ලෙස |
|---|---|---|---|---|---|---|
| | | | මුල් ප්‍රතිපාදන | අවසාන ප්‍රතිපාදන | | |
| 01. | ජාතික ප්‍රතිපත්ති, ආර්ථික කටයුතු, නැවත පදිංචි කිරීම හා පුනරුත්ථාපන, උතුරු පළාත් සංවර්ධන හා යෞවන කටයුතු අමාත්‍යාංශය | උපාධිධාරී අභ්‍යාසලාභින් සඳහා දීමනා | 180 | 180 | 160 | 89 |

### 3.8 මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්ය සාධනය

රු. ,000

| වත්කම් කේතය | කේත විස්තරය | 2019.12.31 දිනට භාණ්ඩ සමීක්ෂණ වාර්තාව අනුව ශේෂය | 2019.12.31 දිනට මූල්‍ය තත්ත්ව වාර්තාව අනුව ශේෂය | ඉදිරියේදී ගිණුම්කරණයට නියමිත | ප්‍රගතිය % ලෙස වාර්තා කිරීම |
|---|---|---|---|---|---|
| 9151 | ගොඩනැගිලි හා ව්‍යුහයන් | - | - | - | |
| 9152 | යන්ත්‍රෝපකරණ | - | 11,734 | - | |
| 9153 | ඉඩම් | - | - | - | |
| 9154 | අස්පෘශ්‍ය වත්කම් | - | - | - | |
| 9155 | ජීව විද්‍යාත්මක වත්කම් | - | - | - | |
| 9160 | කෙරීගෙන යන වැඩ | - | - | - | |
| 9180 | බදු දෙන ලද වත්කම් | - | - | - | |

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. : [illegible]/අයිඑම්/එෆ්එස්/1/19/530
ඔබේ අංකය / உமது இல. / Your No. :
දිනය / திகதி / Date : 2020 ජුනි 30 දින

ප්‍රධාන ගණන්දීමේ නිලධාරී,
තොරතුරු හා ජනමාධ්‍ය අමාත්‍යාංශය.

**ශීර්ෂය - 55, ජනමාධ්‍ය අමාත්‍යාංශයේ 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව.**

---

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

ජනමාධ්‍ය අමාත්‍යාංශයේ 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව ජනමාධ්‍ය අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කරනු ලබන මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ සඳහන් වේ. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව ඉදිරිපත් කළයුතු විගණකාධිපති වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, 2019 දෙසැම්බර් 03 දිනැති අංක 271/2019 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව පිළියෙල කළ එම මූල්‍ය ප්‍රකාශන වලින් 2019 දෙසැම්බර් 31 දිනට ජනමාධ්‍ය අමාත්‍යාංශයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

අංක 306/72, පොල්දුව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව. இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 +94 11 2 88 72 23 ag@auditorgeneral.gov.lk www.auditorgeneral.gov.lk

## 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි 2019 දෙසැම්බර් 03 දිනැති අංක 271/2019 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශය විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වාගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක අවප්‍රකාශයන්ගෙන් තොර බවට තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇති විය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ආර්ථික තීරණ ගැනීමේදී ඒ පිළිබඳව සැලැකිලිමත් විය යුතුය.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීමෙන් වංචා සහ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මඟ හරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීම මාගේ මතයට පදනම් වේ. ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම, හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අමාත්‍යාංශයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- හෙළිදරව් කිරීම ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.

- සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමේදී, මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව,

මාගේ විගණනයෙන් හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

**1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව**

ඉකුත් වර්ෂයේදී මෙම ශීර්ෂය සඳහා අමාත්‍යාංශයක් නොතිබුණු බැවින් ඉකුත් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර නොතිබුණු අතර, සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂයේ මූල්‍ය ප්‍රකාශවලට අනුරූපී වන බව ප්‍රකාශ කළ නොහැකි විය. එසේම ඉකුත් වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් නොවූ බැවින් ඒ සඳහා නිර්දේශ ඉදිරිපත් නොකරන ලදී.

**1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

**1.6.1 මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය**

**1.6.1.1** ආදායම් නොවන ලැබීම්

(අ) තැන්පතු ලැබීම්

භාණ්ඩාගාර පොත් අනුව තැන්පතු ලැබීම් රු.8,783,184 ක් වුවද, එය රු.8,670,154 ක් ලෙස මූල්‍ය ප්‍රකාශනවල දැක්වීම හේතුවෙන් මූල්‍ය කාර්යසාධන ප්‍රකාශයේ තැන්පතු ලැබීම් අගය රු.113,030 කින් අඩුවෙන් දක්වා තිබුණි.

(ආ) අත්තිකාරම් ලැබීම්

භාණ්ඩාගාර පොත් අනුව අත්තිකාරම් ලැබීම් රු.5,996,796 ක් වුවද, එය රු.8,319,728 ලෙස මූල්‍ය ප්‍රකාශනවල සටහන් කිරීම නිසා මූල්‍ය කාර්යසාධන ප්‍රකාශයේ අත්තිකාරම් ලැබීම් රු.2,322,932 කින් වැඩියෙන් දැක්වුණි.

1.6.1.2 තැන්පතු ගෙවීම්

භාණ්ඩාගාර පොත් අනුව තැන්පතු ගෙවීම් රු.1,888,535 ක් වුවද, එය රු.1,159,311 ක් ලෙස මූල්‍ය ප්‍රකාශනවල දැක්වීම හේතුවෙන් මූල්‍ය කාර්යසාධන ප්‍රකාශයේ තැන්පතු ගෙවීම් රු.729,224 කින් අඩුවෙන් දැක්වුණි.

1.6.1.3 අත්තිකාරම් ගෙවීම්

භාණ්ඩාගාර පොත් අනුව අත්තිකාරම් ගෙවීම් රු.26,459,385 ක් වුවද, එය රු.10,810,183 ක් ලෙස මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබීම නිසා මූල්‍ය කාර්යසාධන ප්‍රකාශයේ අත්තිකාරම් ගෙවීම් රු.15,649,202 කින් අඩුවෙන් දක්වා තිබුණි.

**1.6.2 අක් මුදල් ගැලපුම් ගිණුම**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) භාණ්ඩාගාර පොත්වල සඳහන් තැන්පතු ලැබීම් හා ගෙවීම් ශේෂ සහ අත්තිකාරම් ලැබීම් හා ගෙවීම් ශේෂ ගැලපූ විට 2019 දෙසැම්බර් 31 දිනට අග්‍රිම ශේෂය රු.149,286,164 ක් විය යුතු වුවද, එය රු.130,697,837 ක් ලෙස ගැලපීම් කිරීම හේතුවෙන් මූල්‍ය කාර්යසාධන ප්‍රකාශයේ අක් මුදල් රු.18,588,327 කින් අඩුවෙන් දැක්වුණි.

(ආ) අමාත්‍යාංශ පොත් හා භාණ්ඩාගාර ගිණුම් ප්‍රකාශ අනුව අත්තිකාරම් ගිණුමෙහි ලැබීම් හා ගෙවීම් ශේෂයන් අතර වෙනසෙහි ශුද්ධ අගය රු.20,403,945 ක් වුවද, අක් මුදල් ගැලපුම් ගිණුමට එය රු.2,431,811 ක් ලෙස ගැලපීම් කිරීම හේතුවෙන් අක් මුදල් ගැලපීම් රු.17,972,134 කින් අඩුවෙන් දැක්විණි.

(ඇ) අමාත්‍යාංශ පොත් හා භාණ්ඩාගාර ගිණුම් ප්‍රකාශ අනුව තැන්පතු ගිණුමෙහි ලැබීම් හා ගෙවීම් ශේෂයන් අතර වෙනසෙහි ශුද්ධ අගය රු.843,253 ක් වුවද, අක් මුදල් ගැලපුම් ගිණුමට එය රු.227,061 ක් ලෙස ගැලපීම් කිරීම හේතුවෙන් අක් මුදල් ගැලපීම් රු.616,192 කින් අඩුවෙන් දැක්විණි.

**1.6.3 මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය**

1.6.3.1 මූල්‍ය නොවන වත්කම්

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යාංශයේ වත්කම් කළමනාකරණ චක්‍රලේඛ අංක 04/2018 අනුව 2019 ජනවාරි 01 දින සිට ක්‍රියාත්මක වන පරිදි මූල්‍ය නොවන වත්කම් තක්සේරු කර වත්කම්වල ගිණුම්කරණ අගය ලබා ගැනීමට කටයුතු කළයුතු වුවත් සමාලෝචිත වර්ෂයේ වත්කම් මිලදී ගැනීම් පමණක් ඇතුළත් කර තිබූ අතර, පැරණි වත්කම් තක්සේරු කර මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් කර නොතිබුණි.

(ආ) මූල්‍ය නොවන වත්කම් ප්‍රකාශයේ වර්ෂය තුළ මිලදී ගැනීම් ලෙස රු.11,734,358 ක් දක්වා තිබුණද වැය ලෙජර අනුව මූලධන වත්කම් අත්පත් කර ගැනීම් වෙනුවෙන් දරා තිබූ වියදම රු.3,465,801 ක් විය. ඒ අනුව මූල්‍ය නොවන වත්කම් රු.8,268,557 කින් වැඩියෙන් දක්වා තිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂය අවසානය වන විට අමාත්‍යාංශය සතුව වාහන 35 ක් තිබූ අතර, එම වාහනවල වටිනාකම මූල්‍ය නොවන වත්කම් ප්‍රකාශයට ඇතුළත් කර නොතිබූ බැවින් දේපළ පිරියත හා උපකරණවල වටිනාකම නිවැරදි නොවුණි.

1.6.3.2 අග්‍රිම ගිණුමේ ශේෂය

මූල්‍ය ප්‍රකාශනවල මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයෙහි අග්‍රිම ශේෂය ලෙස රු. 261,903 ක් දක්වා තිබුණද භාණ්ඩාගාර ගිණුම් අනුව එම අගය රු.2,397,512 ක් වූයෙන් අග්‍රිම ශේෂය රු. 2,135,609 කින් අඩුවෙන් නිරූපණය කර තිබුණි.

1.6.4 මුදල් ප්‍රවාහ ප්‍රකාශය

1.6.4.1 මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය

මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ මෙහෙයුම් ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුදල් ප්‍රවාහය තුළ ඇතුළත් භාණ්ඩාගාරයට පියවන ලද අග්‍රිම ලෙස රු. 401,930,186 ක් දක්වා තිබුණද, භාණ්ඩාගාරයේ ගිණුම් අනුව එය රු. 399,794,577 ක් වූයෙන් මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය රු. 2,135,609 කින් වැඩියෙන් නිරූපණය කර තිබුණි.

1.6.5 ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම

| ලේඛන වර්ගය | අදාළ රෙගුලාසිය | නිරීක්ෂණ |
|---|---|---|
| (අ) හානි හා පාඩු ලේඛනය | මු.රෙ.110 | 2019 වර්ෂය සඳහා යාවත්කාලීන කර නොතිබුණි. |
| (ආ) ඇප ලේඛනය | මු.රෙ.891(i) | ඇප තැබිය යුතු නිලධාරීන්ගේ හා සේවකයන්ගේ තොරතුරු ඇතුළත් ඇප ලේඛනයක් පිළියෙල කර නොතිබුණි. |
| (ඇ) රාජකාරි දුරකථන ලේඛනය | මු.රෙ.845(i) | මු.රෙ. 845(1) ප්‍රකාරව සහ 26 වැනි පරිශිෂ්ටයේ නියම කර ඇති පරිදි රාජකාරි දුරකථන ලේඛනයක් පවත්වා ගෙන නොතිබුණි. |
| (ඈ) පැමිණීමේ නාම ලේඛනය | | යාවත්කාලීනව පවත්වා නොතිබුණි. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 ආදායම් කළමනාකරණය

(අ) මුදල් රෙගුලාසි 85(1) ඇ සහ මු.රෙ.143(1) ප්‍රකාරව එකතු කිරීමට තිබෙන මුදල් හැකිතාක් දුරට නිවැරදිව තක්සේරු කළයුතු අතර, භාණ්ඩාගාර ලේකම්ගේ 2015 ජූලි 20 දිනැති අංක 01/2015 දිනැති රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති චක්‍රලේඛයේ 03 වන ඡේදය ප්‍රකාරව ආදායම් ඉතා නිවැරදිව පුරෝකථනය කළයුතු වුවද අමාත්‍යාංශයේ ඇස්තමේන්තුගත ආදායම රු.මිලියන 1,200 ක් හා රැස් කරන ලද ආදායම රු.මිලියන 615 ක් විය. ඒ අනුව රැස්කරන ලද ආදායම ඇස්තමේන්තුගත ආදායමෙන් සියයට 51ක් විය.

(ආ) 2007 වර්ෂයේ සිට 2013 වර්ෂය දක්වා වූ කාලපරිච්ඡේදය තුළ පෞද්ගලික මාධ්‍ය ආයතන දෙකකින් අයවිය යුතු බදු ආදායම් දඩ මුදල්ද සමඟ රු.53,157,130 ක් සමාලෝචිත වර්ෂය අවසානය වනවිටත් හිඟ හිට තිබුණ ද, හිඟ ආදායම් ප්‍රකාශයේ සටහන් කර නොතිබුණි.

### 2.2 වියදම් කළමනාකරණය

වැය විෂයන් 25 ක ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 7 සිට සියයට 100 දක්වා ඉතිරිවීම් පැවති අතර, එම වැය විෂයයන්ට අයත් ප්‍රතිපාදන උපයෝජනය නොකිරීම හෝ ඇස්තමේන්තු කිරීමේ දුර්වලතා සිදුවී ඇති බව නිරීක්ෂණය විය.

### 2.3 බැරකම් හා බැඳීම්වලට එළඹීම

සමාලෝචිත වර්ෂයට අදාලව 2020 මැයි 31 දින වනවිට වවුචර්පත් මඟින් ගෙවීම් කර තිබූ රු.232,436 ක් වූ බැරකම් 2019 දෙසැම්බර් 31 දිනට අදාළ වාර්ෂික මූල්‍ය ප්‍රකාශන තුළ සටහන් වී නොතිබුණි.

### 2.4 ප්‍රධාන ගණන් දීමේ නිලධාරී/ ගණන් දීමේ නිලධාරී විසින් සිදුකළ යුතු සහතික වීම.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වන වගන්තියේ විධිවිධාන අනුව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී විසින් පහත සඳහන් කරුණු සම්බන්ධයෙන් සහතික වීම් කළ යුතුව තිබුණත්, ඒ අනුව කටයුතු කර නොතිබුණි.

(අ) අමාත්‍යාංශයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වාගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන් දීමේ නිලධාරී සහතික විය යුතු අතර, එම පද්ධතියේ සඵලදායීතාවය පිළිබඳව කලින් කල සමාලෝචනය සිදුකර ඒ අනුව පද්ධති ඵලදායී ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදුකරනු ලැබිය යුතු බවත්, එම සමාලෝචනයන් ලිඛිතව සිදුකර එහි පිටපතක් විගණකාධිපති වෙත ඉදිරිපත් කළයුතුව තිබුණත්, එවැනි සමාලෝචනයන් සිදුකළ බවට ප්‍රකාශ විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

(ආ) අභ්‍යන්තර විගණන කර්තව්‍ය නිසි පරිදි ක්‍රියාත්මක කිරීම සඳහා ඵලදායී ක්‍රමවේදයක් ඇති බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු වුවත්, එම අවශ්‍යතාවය ඉටුකර නොතිබුණි.

**2.5 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම.**

| නීතිරීති/ විධිවිධානවලට යොමුව | අනුකූල නොවීම |
| --- | --- |
| (අ) ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රවාදී සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය මුදල් රෙගුලාසි 50 | පසුගිය වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණ වාර්තාව සෑම මුදල් වර්ෂයකම මාර්තු 17 දිනට පෙර ප්‍රධාන ගණන් දීමේ නිලධාරියාට ද පිටපතක් සහිතව විගණකාධිපති වෙත යොමු කළයුතු නමුත් අමාත්‍යාංශයෙහි 2019 වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණ වාර්තාව 2020 ජුනි 18 දින වන විටත් ලැබී නොතිබුණි. |
| (ආ) අංක 05/2016 හා 2016 මාර්තු 31 දිනැති රාජ්‍ය මුදල් චක්‍රලේඛය<br>3.1.6 ඡේදය | ඇස්තමේන්තු හැකිතාක් දුරට සම්පූර්ණයෙන් නිවැරදිව පිළියෙල කිරීම ගණන් දීමේ නිලධාරියාගේ වගකීම වන නමුත් වැය විෂයන් 06 කට අදාළව මූලික ඇස්තමේන්තුගත ප්‍රතිපාදනය සංශෝධනය කර තිබූ අවස්ථා විය. |

2.6 තැන්පතු

එකතුව රු.2,267,411 ක් වූ කල් ඉකුත් තැන්පතු මු.රෙ.571 ප්‍රකාරව රාජ්‍ය ආදායමට බැර කිරීමට හෝ හැකි ඉක්මනින් ආපසු ගෙවීමට හෝ කොන්ත්‍රාත් තැන්පතු සම්බන්ධයෙන් වූ විට එම කොන්ත්‍රාත් වලින් වූ අලාභ ආපසු අයකර ගැනීමට හෝ කටයුතු කර නොතිබුණි.

2.7 අත්තිකාරම් නිකුත් කිරීම හා පියවීම

2015 ජුලි 14 දිනැති අංක 3/2015 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය මගින් සංශෝධිත මු.රෙ. 371(5) ප්‍රකාරව කාර්යය නිමකර දින 10 ක් ඇතුළත ලබාගත් තත්කාර්ය අතුරු අග්‍රිමය නිරවුල් කළ යුතු වුවත් අවස්ථා 83 කට අදාළව ලබා දී තිබුණු එකතුව රු. 1,804,012 ක අග්‍රිම, කාර්ය නිම වී දින 31 සිට දින 236 දක්වා කාල පරාසයකින් පසුව පියවා තිබුණි.

2.8 බැංකු ගිණුම් මෙහෙයවීම

2019 දෙසැම්බර් 31 දින වන විට නිකුත් කර තිබූ මාස 6 ඉකුත් වූ රු. 70,703 ක් වටිනා චෙක්පත් 8 ක් සම්බන්ධයෙන් මු.රෙ. 396 (ඇ) ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

2.9 අත්තිකාරම් ගිණුම් ශේෂ

2008 මැයි 16 දින සිට සේවය අතහැර ගොස් තිබූ නිලධාරියකුගෙන් අයවිය යුතු රු.22,588 ක ආපදා ණය ශේෂය සේවය අතහැර ගොස් වර්ෂ 12 ක් ගතවී තිබුණ ද, 2020 මැයි 31 දින වන විටත් අයකරගෙන නොතිබුණි.

## 03. මෙහෙයුම් සමාලෝචනය හා කාර්යසාධනය

ඉදිරිපත් කරනු ලබන මූල්‍ය ප්‍රකාශනවල සඳහන් ආදායම්, වියදම්, වත්කම් හා වගකීම් සම්බන්ධයෙන් මෙහෙයුම් සමාලෝචනය , තිරසාර සංවර්ධනය, යහපාලනය හා මානව සම්පත් කළමනාකරණයට අදාළ විගණන නිරීක්ෂණ ඉහත 1.1 ඡේදයේ දක්වා ඇති 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව ඉදිරිපත් කරනු ලබන වාර්තාවට ඇතුළත් කරනු ලැබේ.

එච්.ජී.සරත්
සහකාර විගණකාධිපති
විගණකාධිපති වෙනුවට

# 04 පරිච්ඡේදය

## කාර්යසාධන දර්ශක

# කාර්ය සාධන දර්ශක

## 4.1 ආයතනයේ කාර්ය සාධන දර්ශක (ක්‍රියාකාරී සැලැස්ම මත පදනම්ව)

| | විශේෂිතවූ දර්ශක | තත්‍ය නිමැවුම අපේක්ෂිත නිමැවුමේ ප්‍රතිශතයක් (%) ලෙස | | |
|---|---|---|---|---|
| | | **100% - 90%** | **75% - 89%** | **50% - 74%** |
| 1 | විකාශන නියාමන කොමිෂන් සභා පනත කෙටුම්පත් කිරීම | 100% | - | - |
| 2 | ජනාධිපති මාධ්‍ය සම්මාන උළෙල - 2018 පැවැත්වීම | 100% | - | - |
| 3 | තොරතුරු දැන ගැනීමේ අයිතිය ප්‍රවර්ධනය කිරීම සඳහා ජනතාව දැනුම්වත් කිරීම | - | 75% | - |
| 4 | වෘත්තීය මාධ්‍යවේදීන් බිහි කිරීම (ඇසිදිසි ජනමාධ්‍ය ශිෂ්‍යත්ව වැඩසටහන) | 100% | - | |

# 05 පරිච්ඡේදය

## තිරසර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්යසාධනය

# තිරසර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ

# කාර්ය සාධනය

## 5.1 හඳුනා ගන්නා ලද අදාළ තිරසාර සංවර්ධන අරමුණු

වගකීම් සහගත මාධ්‍ය සංස්කෘතියක් බිහිකිරීම සඳහා පහසුකම් සලසන අතරතුර මාධ්‍ය ක්‍රියාකාරීත්වයෙහි විශිෂ්ටත්වය කරා ප්‍රවිශ්ය වීම

| අරමුණ/ පරමාර්ථය | ඉලක්කය (ගෝලීය ඉලක්කය) | සාක්ෂාත් කර ගැනීම සඳහා වන දර්ශක | වර්තමානය වන විට සාක්ෂාත් කර ගැනීමේ ප්‍රගතිය | | |
|---|---|---|---|---|---|
| | | | 0% - 49% | 50% - 74% | 75%- 100% |
| 4.ගුණාත්මක අධ්‍යාපනය | 4.4 2030 වන විට රැකියා, සුනිසි රැකියා සහ ව්‍යවසායකත්වය සඳහා අවැසි තාක්ෂණික සහ වෘත්තීය නිපුනතා ද ඇතුලු අදාල නිපුනතා සහිත තරුණ සහ වැඩිහිටි ජනගහනය ක්‍රමිකව වැඩි කිරීම | ජාතික මාධ්‍ය උසස් අධ්‍යාපන ආයතනය | 10% | | |
| | | ඇසි දිසි ජනමාධ්‍ය ශිෂ්‍යත්ව වැඩසටහන | | | 100% |
| | | ජනාධිපති මාධ්‍ය සම්මාන උළෙල | | | 100% |
| 16.සාමය යුක්තිය සහ ශක්තිමත් ආයතන | 16.10 ජාතික නීතිය සහ ජාත්‍යන්තර ගිවිසුම් ප්‍රකාරව තොරතුරු වලට මහජනතාවට ප්‍රවේශ වීමේ හැකියාව සහතික කොට මූලික නිදහස තහවුරු කරලීම. | තොරතුරු දැනගැනීම පිළිබඳ පනත සැකසීම | | | 100% |
| | | තොරතුරු දැනගැනීම පිළිබඳ ඒකකය අමාත්‍යංශය තුල පිහිටුවීම | | | 100% |
| | | තොරතුරු නිලධාරීන් සහ රාජ්‍ය නිලධාරීන් දැනුවත් කිරීමේ වැඩසටහන් | | | 100% |
| | | මහජනතාව සඳහා දැනුවත් කිරීමේ වැඩසටහන් | | | 80% |

## 5.2 තිරසර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීමේ ජයග්‍රහණ හා අභියෝග

**ජයග්‍රහණ**

i. වෘත්තීය ජනමාධ්‍යවේදීන් ජනමාධ්‍ය ක්ෂේත්‍රයට බිහි කිරීමේ අරමුණින් ජාතික ජනමාධ්‍ය ආයතනයක් ස්ථාපිත කිරීම සඳහා වන ව්‍යාපෘති වාර්තාව මෙම අමාත්‍යාංශය මඟින් ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුවේ නිර්දේශ ලබාගැනීම සඳහා ඉදිරිපත් කරන ලද අතර එම දෙපාර්තමේන්තුව ප්‍රතිපත්තිමය වශයෙන් මෙම ව්‍යාපෘති සංකල්පයට එකඟතාවය පල කර ඇත.

ii. තොරතුරු දැනගැනීමේ අයිතිය පිළිබඳ පනත ක්‍රියාත්මක කර එය සමාජගත කිරීමේ වගකීම මෙම අමාත්‍යාංශය විසින් දරනු ලබන අතර මෙම ක්‍රියාවලිය සාර්ථක කර ගැනීමෙහිලා මේ සඳහාම වෙන්වූ ඒකකයක් අමාත්‍යාංශය යටතේ ස්ථාපිත කර ඇත. පනත ක්‍රියාත්මක කිරීම සම්බන්ධ සියළු කටයුතු මෙම ඒකකය හරහා සිදු කෙරේ.

**අභියෝග :**

i. සමස්ත රාජ්‍ය ප්‍රවේශය සඳහා රාජ්‍ය ආයතන අතර සුසංයෝගයක් ඇති කර ගැනීම හරහා සාමූහික ක්‍රියාමාර්ග හඳුනා ගැනීම හා ඒකාබද්ධ සැලසුම්කරණයකට ප්‍රවිෂ්ට වීම.

ii. තිරසර සංවර්ධන ඉලක්ක ළඟා කර ගැනීමට අදාල කරගන්නා නියාමනයන් කිරීමට ශක්තිමත් ක්‍රමවේදයක් හඳුන්වා දීම.

iii. රාජ්‍ය මාධ්‍ය ආයතන තාක්ෂණයෙන් සවිබල ගැන්වීම.

iv. මෙම ඉලක්ක සපුරා ගැනීම සඳහා පෞද්ගලික මාධ්‍ය මෙන්ම සමාජ මාධ්‍ය කාර්යක්ෂමව යොදා ගැනීම.

v. රාජ්‍ය මාධ්‍ය ආයතන ලාභ ඉපැයීමම අරමුණු කර කටයුතු නොකරන බැවින් තිරසාර සංවර්ධන ඉලක්ක ළඟා කර ගැනීමට අවශ්‍ය වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සඳහා ප්‍රතිපාදන ලබා ගැනීම.

# 06 පරිච්ඡේදය

## මානව සම්පත් පැතිකඩ

# මානව සම්පත් පැතිකඩ

## 6.1 සේවක සංඛ්‍යා කළමනාකරණය

| කාණ්ඩය | අනුමත සේවක සංඛ්‍යාව | පවතින සේවක සංඛ්‍යාව | පුරප්පාඩු | (අතිරික්ත) ** |
|---|---|---|---|---|
| ජ්‍යෙෂ්ඨ | 20 | 13 | 08 | 01* |
| තෘතීයික | 04 | 02 | 02 | 00 |
| ද්වීතියික | 81 | 61 | 20 | 00 |
| ප්‍රාථමික | 39 | 34 | 05 | 00 |
| **එකතුව** | **144** | **110** | **35** | **01** |

*අනුමත කාර්ය මණ්ඩලයේ කාර්ය මණ්ඩල ව්‍යුහය තුළ රාජ්‍ය ලේකම්වරයෙකු නොමැති වුවද මෙම අමාත්‍යාංශයේ රාජ්‍ය ලේකම්වරයෙකු සිටීම.

## 6.2 ** ආයතනයේ කාර්ය සාධනය උදෙසා මානව සම්පත් හිඟය හෝ අතිරික්තයේ බලපෑම

රජයේ ප්‍රතිපත්තිමය තීරණයකට අනුව රාජ්‍ය අමාත්‍යාංශයක් ලෙස ජනමාධ්‍ය අමාත්‍යාංශය ගැසට් කිරීම හේතුවෙන් මෙම අතිරික්ත රාජ්‍ය ලේකම් තනතුර ඇති කෙරිණි. රාජ්‍ය ප්‍රතිපත්ති අනුව ඉදිරියේදී එම තනතුරෙහි පැවැත්ම තීරණය කරනු ඇත.

කාර්ය මණ්ඩලයේ 35 දෙනෙකුගේ හිඟයක් පවතී. ශ්‍රම බලකායට හිඟයක් ඇති විට, සෑම සේවකයෙකුටම පැවරෙන අතිරේක රාජකාරි කටයුතු ප්‍රමාණය නිසි වේලාවට අවසන් කිරීමට, මානසික ආතතියකින් සහ තෘප්තිමත්භාවයකින් තොරව කටයුතු කිරීමට සිදුවේ. එය කාර්ය මණ්ඩලයේ කාර්ය සාධනය පහළ හෙලන අතරම සමස්තයක් ලෙස ආයතනයේ කාර්ය සාධනය අවම කරයි.

## 6.3 මානව සම්පත් සංවර්ධනය

| වැඩසටහනෙහි නම | පුහුණු කරන ලද කාර්ය මණ්ඩලය | වැඩසටහන් කාලය | මුළු ආයෝජනය (රු.) | | වැඩසටහනෙහි ස්වභාවය (විදෙස් / දේශීය) | සාක්ෂාත් කරගත් ප්‍රතිඵල/දැනුම |
|---|---|---|---|---|---|---|
| | | | දේශීය | විදෙස් | | |
| ජාතික විගනණ පනත | 350 | දින 1 | 345,277.5 | | දේශීය | අමාත්‍යාංශයෙහි කාර්යසාධනය ඉහල නැංවීම |
| ගබඩා කලමනාකරණය සහ මහජන වත්කම් අපහරණ ක්‍රියාපටිපාටිය | 02 | දින 2 | 17,000 | | දේශීය | අමාත්‍යාංශයෙහි කාලය හා සම්පත් නාස්තිය අවම කිරීම |
| ප්‍රවාහන කටයුතු, මාර්ග නීතිය, තාක්ෂණික දැනුම සහ අභිප්‍රේරණය | 15 | දින 1 | 19,650 | | දේශීය | සේවකයන්ගේ ක්ෂේත්‍රයෙහි සාර්ථකත්වය ඇතිකරවීමේ අභිප්‍රේරණය ඇතිකිරීම |
| ව්‍යාපෘති කලමනාකරණය | 32 | මාස 3 | 372,585 | | දේශීය | අමාත්‍යාංශයෙහි කාර්යසාධනය ඉහල නැංවීම |
| නිවාඩු ලිපිකරුගේ රාජකාරි සහ වගකීම් | 1 | දින 2 | 8,500 | | දේශීය | පුද්ගල වෘත්තීය සංවර්ධනය |
| රාජ්‍ය මූල්‍ය රෙගුලාසි | 1 | දින 3 | 18,000 | | දේශීය | පුද්ගල වෘත්තීය සංවර්ධනය |
| ව්‍යාපෘති කලමනාකරණය | 35 | දින 1 | 32,100 | | දේශීය | අමාත්‍යාංශයෙහි කාර්යසාධනය ඉහල නැංවීම |
| ව්‍යාපෘති කලමනාකරණය | 1 | දින 1 | 5,000 | | දේශීය | පුද්ගල වෘත්තීය සංවර්ධනය |
| විදේශ සංචරණ සිදුවීම් හා යැපීම් | 1 | දින 1 | 5,000 | | දේශීය | පුද්ගල වෘත්තීය සංවර්ධනය |
| ප්‍රවාහන කලමනාකරණය | 1 | දින 2 | 8,500 | | දේශීය | පුද්ගල වෘත්තීය සංවර්ධනය |
| Management for Success | 3 | දින 7 | | 874,504.95 | විදෙස් | නව්‍ය ආකල්ප සංවර්ධනය |
| International Program on Management | 1 | දින 8 | | 249,000 | විදෙස් | කලමනාකරණයේදී යොදා ගැනීම සඳහා දැනුම |
| International Event Program on Management | 1 | දින 10 | | 1,338,572.52 | විදෙස් | කලමනාකරණයේදී යොදා ගැනීම සඳහා දැනුම |
| Open Government Partnership Global Summit | 1 | දින 8 | | 328,729 | විදෙස් | ප්‍රතිපත්ති සැලසුම් සංවර්ධනය |
| Seminar for Press Officials and Media Professionals from BRI countries | 1 | දින 21 | | 168,152.65 | විදෙස් | පුද්ගල වෘත්තීය සංවර්ධනය |
| Conference in the Hague | 1 | දින 7 | | 299,518 | විදෙස් | සයිබර් ආරක්ෂාව පිළිබඳ දැනුම්වත්භාවය ඉහල නැංවීම |

## 6.4 ආයතනයේ කාර්ය සාධනය උදෙසා පුහුණු වැඩසටහන්වල දායකත්වය

නිලධාරීන් පුහුණු පාඨමාලාවන්ට යොමු කිරීමේ අරමුණ නම් කාර්යාලීය වැඩකටයුතු නිසි අයුරින්, ක්‍රමවත්ව හා කාර්යක්ෂමව ඉටු කරවා ගැනීමට ඔවුන් පොළඹවා ගැනීමයි. පුහුණු පාඨමාලා, නිලධාරීන්ගේ දැනුම යාවත්කාලීන කරන අතර ඔවුන්ගේ හැකියා වර්ධනය වැඩිදියුණු කිරීමටද ඉවහල් වේ. මෙම අමාත්‍යංශය නිලධාරීන් සඳහා දමිළ භාෂා පාඨමාලාව, ඉංග්‍රීසි භාෂා පාඨමාලාව හා ව්‍යාපෘති කළමනාකරණ පාඨමාලාව වැනි සේවාස්ථ පුහුණු පාඨමාලාවන් වශයෙන් හඳුන්වා දුන් අතර මෙම පාඨමාලා සඳහා රජයේ පිළිගත් ආයතනවල සම්පත් දායකයින්ගේ දායකත්වය ලබා ගන්නා ලදී.

රාජ්‍ය අංශයට නවක පත්වීම් ලද අමාත්‍යංශයට අනුයුක්ත කරන ලද නිලධාරීන් අනිවාර්ය පුහුණු පාඨමාලාවලටද යොමු කරන අතර මෙමගින් ඔවුන් රැකියාවට වඩා හොඳින් අනුගත වේ.

තවද මෙම පුහුණු පාඨමාලා තුළින් නිලධාරීන්ට රාජකාරී පරිසරයේ ඒකාකාරී බවින් මිදීමට හා නව දැනුමින් සන්නද්ධ වීමට අවස්ථාව ලැබේ.

නිලධාරීන් පුහුණු පාඨමාලාවන්ට යොමු කිරීම තුළින් අමාත්‍යංශයේ කාර්ය සාධනය ඉහළ නැංවීමට හැකියාව ලැබේ.

# 07 පරිච්ඡේදය

## අනුකූලතා වාර්තාව

# අනුකූලතා වාර්තාව

| අංකය | අදාළ කර ගත යුතු අවශ්‍යතාව | අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/ අනුකූල නොවේ) | අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම | අනුකූල නොවීම අනාගතයේදී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග |
|---|---|---|---|---|
| **1** | **පහත සඳහන් මූල්‍ය ප්‍රකාශ/ ගිණුම් නියමිත දිනට ඉදිරිපත් කොට තිබේ** | | | |
| 1.1 | වාර්ෂික මූල්‍ය ප්‍රකාශ | අනුකූල වේ | - | - |
| 1.2 | රාජ්‍ය නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම | අනුකූල වේ | - | - |
| 1.3 | ව්‍යාපාර හා නිෂ්පාදන අත්තිකාරම් ගිණුම් (වාණිජ අත්තිකාරම් ගිණුම්) | අදාළ නොවේ | - | - |
| 1.4 | ගබඩා අත්තිකාරම් ගිණුම් | අදාළ නොවේ | - | - |
| 1.5 | විශේෂ අත්තිකාරම් ගිණුම් | අදාළ නොවේ | - | - |
| 1.6 | වෙනත් | අදාළ නොවේ | - | - |
| **2** | **පොත්පත් හා ලේඛන නඩත්තු කිරීම (මු.රෙ.445)** | | | |
| 2.1 | රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 267/2018 අනුව ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 2.2 | පුද්ගල පඩිනඩි ලේඛන/ පුද්ගල පඩිනඩි කාඩ්පත් යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | - | - |
| 2.3 | විගණන විමසුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | - | - |
| 2.4 | අභ්‍යන්තර විගණන වාර්තා ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | - | - |
| 2.5 | සියළුම මාසික ගිණුම් සාරාංශ (CIGAS) පිළියෙල කර නියමිත දිනට මහා භාණ්ඩාගාරයට ඉදිරිපත් කිරීම | අනුකූල වේ | - | - |

| | | | | |
|---|---|---|---|---|
| 2.6 | චෙක්පත් හා මුදල් ඇණවුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | - | - |
| 2.7 | ඉන්වෙන්ට්‍රි ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | - | - |
| 2.8 | තොග ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | - | - |
| 2.9 | හානි පාඩු ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | - | - |
| 2.10 | බැරකම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | - | - |
| 2.11 | උප පත්‍රිකා පොත් ලේඛනය (GA – N 20) යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | - | - |
| **03** | **මූල්‍ය පාලනය සඳහා කාර්යයන් අභිනියෝජනය කිරීම (මු.රෙ.135)** | | | |
| 3.1 | මූල්‍ය බලතල ආයතනය තුළ බලතල පවරා දී තිබීම | අනුකූල වේ | - | - |
| 3.2 | මූල්‍ය බලතල පවරා දීම පිළිබඳ ආයතනය තුළ දැනුවත් කර තිබීම | අනුකූල වේ | - | - |
| 3.3 | සෑම ගණුදෙනුවක්ම නිලධාරීන් දෙදෙනෙකු හෝ ඊට වැඩි සංඛ්‍යාවක් හරහා අනුමත වන පරිදි බලතල පවරා දී තිබීම | අනුකූල වේ | - | - |
| 3.4 | 2014.05.11 දිනැති 171/2004 දරණ රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය අනුව, රජයේ පඩිපත් මෘදුකාංග පැකේජය භාවිතා කිරීමේදී ගණකාධිකාරීවරයන්ගේ පාලනයට යටත්ව කටයුතු කිරීම | අනුකූල වේ | - | - |
| **4** | **වාර්ෂික සැලසුම් සකස් කිරීම** | | | |
| 4.1 | වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම | අනුකූල වේ | - | - |
| 4.2 | වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම සකස් කිරීම | අනුකූල වේ | - | - |

| | | | | |
|---|---|---|---|---|
| 4.3 | වාර්ෂික අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම | අනුකූල වේ | - | - |
| 4.4 | වාර්ෂික ඇස්තමේන්තුව සකස් කොට ජාතික අයවැය දෙපාර්තමේන්තුවට (NBD) නියමිත දිනට ඉදිරිපත් කිරීම | අනුකූල වේ | - | - |
| 4.5 | වාර්ෂික මුදල් ප්‍රවාහ ප්‍රකාශය නියමිත දිනට භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම. | අනුකූල වේ | - | - |
| **5** | **විගණන විමසුම්** | | | |
| 5.1 | විගණකාධිපතිවරයා විසින් නියම කොට ඇති දිනට, සියළුම විගණන විමසුම්වලට පිළිතුරු ලබා දී තිබීම | අනුකූල වේ | - | - |
| **6** | **අභ්‍යන්තර විගණනය** | | | |
| 6.1 | මු.රෙ.134(2) DMA/1-2019 අනුව, වසර ආරම්භයේදී විගණකාධිපතිවරයා සමඟ සාකච්ඡා කිරීමෙන් අනතුරුව, අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම | අනුකූල වේ | | - |
| 6.2 | සෑම අභ්‍යන්තර විගණන වාර්තාවකටම මාසයක කාලයක් තුළදී පිළිතුරු සපයා තිබීම | අනුකූල වේ | | |
| 6.3 | 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 40(4) උප වගන්තිය ප්‍රකාරව, සියළුම අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම | අනුකූල වේ | | |
| 6.4 | මුදල් රෙගුලාසි 134(3) ප්‍රකාරව, සියළුම අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් විගණකාධිපතිවරයාට ඉදිරිපත් කර තිබීම | අනුකූල වේ | | |

| | | | | |
|---|---|---|---|---|
| **7** | **විගණන හා කළමනාකරණ කමිටු** | | | |
| 7.1 | DMA චක්‍රලේඛ 1-2019 අනුව, අවම වශයෙන් විගණන හා කළමනාකරණ කමිටු 04ක් වත් අදාළ වර්ෂය තුළ පවත්වාගෙන තිබීම | අනුකූල නොවේ | වසර ආරම්භයේ සිට තෙවන කාර්තුව දක්වා නිලධාරී හිඟය හේතුවෙන් කමිටු රැස්වීම් නිසි පරිදි පැවැත්වීමට නොහැකි විය. | ඉදිරි රැස්වීම් නිසි පරිදි පැවැත්වීමට කටයුතු කෙරේ. |
| **8** | **වත්කම් කළමනාකරණය** | | | |
| 8.1 | අංක 01/2017 දරණ වත්කම් කළමනාකරණ චක්‍රලේඛයේ 07 වන පරිච්ඡේදය අනුව, වත්කම් මිලදී ගැනීම් හා අපහරණය කිරීම් පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය වෙත ඉදිරිපත් කර තිබීම | අනුකූල වේ | | |
| 8.2 | ඉහත සඳහන් චක්‍රලේඛයේ 13 වන පරිච්ඡේදය ප්‍රකාරව, එම චක්‍රලේඛයේ විධි විධාන ක්‍රියාත්මක කිරීම, සම්බන්ධීකරණය සඳහා සුදුසු සම්බන්ධතා නිලධාරියෙකු පත් කර එම නිලධාරියා පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලයට වාර්තා කර තිබීම | අනුකූල වේ | - | - |
| 8.3 | රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 05/2016 අනුව, භාණ්ඩ සමීක්ෂණ පවත්වා අදාළ වාර්තා නියමිත දිනට විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම | අනුකූල නොවේ | 2019 වර්ෂයට අදාළ භාණ්ඩ සමීක්ෂණ කටයුතු සිදු කෙරෙමින් පවතී. | |
| 8.4 | වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයෙන් අනාවරණය වූ අතිරික්ත, ඌනතා හා වෙනත් නිර්දේශ චක්‍රලේඛයේ සඳහන් කාලය තුළ සිදු කොට තිබීම | අනුකූල නොවේ | 2019 වර්ෂයට අදාළ භාණ්ඩ සමීක්ෂණ කටයුතු සිදු කෙරෙමින් පවතී. | |
| 8.5 | ගර්හිත භාණ්ඩ අපහරණය කිරීම මු.රෙ.772 අනුව සිදු කිරීම | අනුකූල නොවේ | 2019 වර්ෂයට අදාළ භාණ්ඩ සමීක්ෂණ කටයුතු සිදු කෙරෙමින් පවතී. | |

| | | | | |
|---|---|---|---|---|
| **9** | **වාහන කළමනාකරණය** | | | |
| 9.1 | සංචිත වාහන සඳහා දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ වාර්තා සකස් කොට නියමිත දිනට විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීම | අනුකූල වේ | - | - |
| 9.2 | වාහන ගර්භිත වී මාස 06කට වඩා අඩු කාලයකදී අපහරණය කර තිබීම | අනුකූල වේ | - | - |
| 9.3 | වාහන ලොග් පොත් පවත්වා ගනිමින් ඒවා යාවත්කාලීන කර පවත්වාගෙන යාම. | අනුකූල වේ | - | - |
| 9.4 | සෑම වාහන අනතුරක් සම්බන්ධයෙන්ම මු.රෙ.103, 104, 109 හා 110 ප්‍රකාරව කටයුතු කිරීම | අනුකූල වේ | | |
| 9.5 | 2016.12.29 දිනැති අංක 2016/30 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1 ඡේදයේ සඳහන් විධි විධාන ප්‍රකාරව, වාහනවල ඉන්ධන දහනය වීම නැවත පරීක්ෂා කිරීම | අනුකූල වේ | - | - |
| 9.6 | කල්බදු කාල සීමාවෙන් අනතුරුව, බදු වාහන ලොග් පොත්වල සම්පූර්ණ අයිතිය පවරා ගෙන තිබීම | අදාළ නොවේ | - | - |
| **10** | **බැංකු ගිණුම් කළමනාකරණය** | | | |
| 10.1 | නියමිත දිනට බැංකු සැසඳුම් ප්‍රකාශ පිළියෙල කර සහතික කර ඒවා විගණනය සඳහා ඉදිරිපත් කර තිබීම | අනුකූල වේ | - | - |
| 10.2 | සමාලෝචිත වර්ෂයේදී හෝ ඊට පෙර වර්ෂවල සිට ඉදිරියට රැගෙන ආ අක්‍රීය බැංකු ගිණුම් නිරවුල් කර තිබීම | අනුකූල වේ | - | - |
| 10.3 | බැංකු සැසඳුම් ප්‍රකාශවලින් අනාවරණය වූ හා ගැලපුම් කළ යුතුව තිබූ ශේෂ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කොට එම ශේෂ මාසයක කාලයක් ඇතුළත නිරවුල් කර තිබීම | අනුකූල වේ | - | - |

| | | | | |
|---|---|---|---|---|
| **11** | **ප්‍රතිපාදන උපයෝජනය** | | | |
| 11.1 | සලසා තිබූ ප්‍රතිපාදන ඒවායේ සීමාව ඉක්මවා නොයන පරිදි වියදම් දැරීම | අනුකූල වේ | - | - |
| 11.2 | මු.රෙ.94(1) ප්‍රකාරව, සලසන ලද ප්‍රතිපාදනයෙන් උපයෝජනය කළ පසු වර්ෂ අවසානයේදී ඉතිරි ප්‍රතිපාදන සීමාව නොඉක්මවන පරිදි බැරකම්වලට එළඹීම. | අනුකූල වේ | | |
| **12** | **රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම්** | | | |
| 12.1 | සීමාවන්වලට අනුකූල වීම | අනුකූල වේ | - | - |
| 12.2 | හිඟ හිටි ණය ශේෂ පිළිබඳ කාල විශ්ලේෂණයක් සිදු කර තිබීම | අනුකූල වේ | - | - |
| 12.3 | වර්ෂයකට වැඩි කාලයක සිට පැවත එන හිඟ හිටි ණය ශේෂ නිරවුල් කර තිබීම | අනුකූල වේ | | |
| **13** | **පොදු තැන්පත් ගිණුම** | | | |
| 13.1 | කල් ඉකුත් වූ තැන්පතු සම්බන්ධයෙන් මු.රෙ.571 ප්‍රකාරව කටයුතු කර තිබීම | අනුකූල වේ | | |
| 13.2 | පොදු තැන්පතු සඳහා වන පාලන ගිණුම යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | - | - |
| **14** | **අග්‍රිම ගිණුම** | | | |
| 14.1 | සමාලෝචිත වර්ෂය අවසානයේ දී මුදල් පොතේ ශේෂය භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ප්‍රේෂණය කර තිබීම | අනුකූල වේ | - | - |
| 14.2 | මු.රෙ.371 ප්‍රකාරව නිකුත් කළ තත්කාරිය අතුරු අග්‍රිම, එම කාර්යය අවසන් වී මාසයක් ඇතුළත නිරවුල් කර තිබීම | අනුකූල වේ | | - |

| | | | | |
|---|---|---|---|---|
| 14.3 | මු.රෙ.371 ප්‍රකාරව අනුමත සීමාව ඉක්මවා නොයන පරිදි තත්කාර්ය අතුරු අග්‍රිම නිකුත් කර තිබීම | අනුකූල වේ | - | - |
| 14.4 | අග්‍රිම ගිණුමේ ශේෂය, භාණ්ඩාගාරයේ පොත් සමඟ මාසිකව සැසඳුම් කිරීම | අනුකූල වේ | - | - |
| **15** | **ආදායම් ගිණුම** | | | |
| 15.1 | අදාළ රෙගුලාසිවලට අනුකූලව, රැස් කළ ආදායමෙන් ආපසු ගෙවීම් සිදු කොට තිබීම | අනුකූල වේ | - | - |
| 15.2 | රැස් කර තිබූ ආදායම්, තැන්පතු ගිණුමට බැර නොකොට ඍජුවම ආදායමට බැර කර තිබීම | අනුකූල වේ | - | - |
| 15.3 | මු.රෙ.176 අනුව හිඟ ආදායම් වාර්තා විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම | අදාළ නොවේ | - | - |
| **16** | **මානව සම්පත් කළමනාකරණය** | | | |
| 16.1 | අනුමත කාර්ය මණ්ඩල සීමාව තුළ කාර්ය මණ්ඩලය පවත්වා ගෙන යාම | අනුකූල වේ | - | - |
| 16.2 | කාර්ය මණ්ඩලයේ සියළුම සාමාජිකයින් වෙත රාජකාරී ලැයිස්තු ලිඛිතව ලබා දී තිබීම | අනුකූල වේ | | |
| 16.3 | 2017.09.20 දිනැති MSD චක්‍රලේඛ අංක 04/2017 ප්‍රකාරව සියළුම වාර්තා, කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර තිබීම. | අනුකූල වේ | - | - |
| **17** | **මහජනයා වෙත තොරතුරු ලබා දීම** | | | |
| 17.1 | තොරතුරු දැන ගැනීමේ පනත හා රෙගුලාසි ප්‍රකාරව තොරතුරු නිලධාරියෙකු පත් කොට තොරතුරු ලබා දීමේ ලේඛනයක් යාවත්කාලීන කර පවත්වා ගෙන යාම | අනුකූල වේ | - | - |

| | | | | |
|---|---|---|---|---|
| 17.2 | ආයතනය පිළිබඳ තොරතුරු එහි වෙබ් අඩවිය හරහා ලබා දී තිබෙන අතර, වෙබ් අඩවිය හරහා හෝ විකල්ප මාර්ග හරහා ආයතනය පිළිබඳ මහජනයාගේ ප්‍රශංසා / චෝදනා පල කිරීමට පහසුකම් සලසා තිබීම. | අනුකූල වේ | - | - |
| 17.3 | තොරතුරු දැන ගැනීමේ පනතේ 08 වන හා 10 වන වගන්ති ප්‍රකාරව වසරකට දෙවතාවක් හෝ වසරකට වරක් වාර්තා ඉදිරිපත් කර තිබීම. | අනුකූල වේ | - | - |
| **18** | **පුරවැසි ප්‍රඥප්තිය ක්‍රියාත්මක කිරීම** | | | |
| 18.1 | අංක 05/2008 හා 05/2018(1) දරණ රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශ චක්‍රලේඛ අනුව පුරවැසි/ සේවාලාභී ප්‍රඥප්තියක් සම්පාදනය කොට ක්‍රියාත්මක කිරීම | අනුකූල නොවේ | දැනට කියාත්මක නොවේ. ඉදිරි වර්ෂ සඳහා යාවත්කාලීන කිරීමට කටයුතු කරනු ලැබේ. | |
| 18.2 | එම චක්‍රලේඛයේ 2.3 ඡේදය පරිදි, පුරවැසි/ සේවාලාභී ප්‍රඥප්තිය සම්පාදනය කිරීම හා ක්‍රියාත්මක කිරීමේ කටයුතු අධීක්ෂණය කිරීම හා ඇගයීම සඳහා ආයතන විසින් ක්‍රමවේදයක් සකස් කොට තිබීම | අනුකූල නොවේ | ඉදිරි වර්ෂ සඳහා සකස් කිරීමට කටයුතු කරනු ලැබේ. | |
| **19** | **මානව සම්පත් සැලැස්ම සම්පාදනය කිරීම** | | | |
| 19.1 | 2018.01.24 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 02/2018 ඇමුණුම 02 ආකෘතිය පදනම් කරගෙන මානව සම්පත් සැලැස්මක් සකස් කොට තිබීම. | අනුකූල නොවේ | ඉදිරි වර්ෂ සඳහා සකස් කිරීමට කටයුතු කරනු ලැබේ. | |
| 19.2 | කාර්ය මණ්ඩලයේ සෑම සාමාජිකයෙකු සඳහාම වර්ෂයකට අවම වශයෙන් පැය 12කට නොඅඩු | අනුකූල නොවේ | ඉදිරි වර්ෂ සඳහා විධිමත් පරිදි පුහුණු අවස්ථාවන් සැලැස්ම තුළ ඇතුලත් කර ගැනීමට කටයුතු කරනු | |

| | | | | |
|---|---|---|---|---|
| | පුහුණු අවස්ථාවක් ඉහත සඳහන් මානව සම්පත් සැලැස්ම තුළ තහවුරු කොට තිබීම | | ලැබේ | |
| 19.3 | ඉහත සඳහන් චක්‍රලේඛයේ ඇමුණුම 01 හි දැක්වෙන ආකෘතිය පදනම් කරගෙන සමස්ත කාර්ය මණ්ඩලය සඳහාම වාර්ෂික කාර්ය සාධන ගිවිසුම් අත්සන් කර තිබීම | අනුකූල නොවේ | ඉදිරි වර්ෂ සඳහා ගිවිසුම් අත්සන් කර ගැනීමට කටයුතු කරනු ලැබේ | |
| 19.4 | ඉහත චක්‍රලේඛයේ 6.5 ඡේදය ප්‍රකාරව මානව සම්පත් සංවර්ධන සැලැස්ම පිළියෙල කිරීම, ධාරිතා සංවර්ධන වැඩසටහන් සංවර්ධනය කිරීම, නිපුණතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම පිළිබඳ වගකීම් පවරා ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකු පත් කොට තිබීම | අනුකූල වේ | | |
| **20** | **විගණන ඡේදවලට ප්‍රතිචාර දැක්වීම** | | | |
| 20.1 | ඉකුත් වර්ෂ සඳහා විගණකාධිපති විසින් නිකුත් කළ විගණන ඡේද මගින් පෙන්වා දී ඇති අඩුපාඩු නිවැරදි කොට තිබීම | අනුකූල වේ | | |

ජනමාධ්‍ය අමාත්‍යාංශය
ஊடக அமைச்சு
Ministry of Mass Media

අංක.163, ඇසිදිසි මැදුර, කිරුළපන මාවත, පොල්හේන්ගොඩ, කොළඹ 05.
163, அசிதிசி மெந்தர, கிருளப்பனை மாவத்தை பொல்ஹேன்கொடை, கொழும்பு 05
163, Asi Disi Medura, Kirulapone Mawatha, Polhengoda, Colombo 05

**www.media.gov.lk**

Department of Government Printing